# වාර්ෂික වාර්තාව

# 2020

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකාව

## දැක්ම

සියලු දෙනාට ම විශ්වසනීය, අපක්ෂපාතී, ස්වාධීන, පරිශීලක මිත්‍ර සහ ප්‍රවේශ විය හැකි අධිකරණ ක්‍රමයක් සාක්ෂාත් කරගැනීම පිණිස විනිශ්චයකාරවරයන්ගේ වෘත්තිමය විශේෂඥතාව වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම උදෙසා විනිශ්චයකාරවරයන් විෂයෙහිලා අධිකරණමය පුහුණුවීම් ලබා දීමේ දී, සහ ඉතාමත් ඉහළ මට්ටමේ පුහුණුවීම් සහ පර්යේෂණ පහසුකම් සැපයීමේ දී, විශිෂ්ඨ ගණයේ ආයතනයක් වශයෙන් ක්‍රියා කරන්නෙමු.

## මෙහෙවර

විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් හරහා අධිකරණ නිලධාරීන්ගේ වෘත්තීමය විශේෂඥතාව සහ යුක්තියේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම පිණිස ඉහල මට්ටමේ දැනුමක් සහ කුසලතාවක් අධිකරණ නිලධාරීන්ට ලබාදීම හරහා ආයතනයේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කරන්නෙමු.

ඒ අනුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පහත සඳහන් පරමාර්ථ සපුරා ගැනීමට දායක වෙමින් ස්වකීය මෙහෙවර පරිපූර්ණ කර ගැනීමට අපේක්ෂාවෙන් කටයුතු කරයි. එම පරමාර්ථ මෙසේ ය.

- අධිකරණ නිලධාරීන් සඳහා අඛණ්ඩ පුහුණුව ලබාදීම;
- පර්යේෂණ, ප්‍රකාශන පළකිරීම සහ තාක්ෂණික සහාය ලබාදීම හරහා අධිකරණ නිලධාරීන්ට සහයෝගීතාව දැක්වීම;
- අධිකරණ හා නෛතික කාරණාවන් පිළිබඳව අධිකරණ නිලධාරීන් විසින් අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලැස්වීම;
- අධිකරණ නිලධාරීන්ගේ වෘත්තිමය විශේෂඥතාව වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම සහ කුසලතාවය වර්ධනය කිරීම ඉලක්ක කරගෙන සම්මන්ත්‍රණ, සම්මේලන, දේශන සහ වැඩමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම;
- ප්‍රමාදය අවම කිරීමේ දී නඩු කළමනාකරණය සහ නඩු ප්‍රවාහ කළමනාකරණය මඟින් වැඩිම යහපත ගෙන දෙන පරිචයන් සහ ව්‍යවහාරයන් සාක්ෂාත් කරගැනීම පිණිස මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමට දායක වීම;
- යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ විවිධ අංශ පිළිබඳව පර්යේෂණ කටයුතු ඉටු කිරීම;
- විනිශ්චයකාරවරයන් ඉලක්ක කරගෙන පුස්තකාල සහ වෙබ් අඩවි පාදක, අධ්‍යාපන පහසුකම් සැපයීම සහ නීතිමය තොරතුරු සහ කාරණාවන් ප්‍රචලිත කිරීම;
- අන්තර්ජාතික අධිකරණ ආයතන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වාගෙන යාම;
- අධිකරණ ක්‍රමය තුළ මහජන භාරය සහ විශ්වාසය ආරක්ෂා කිරීම පිණිස නඩු කියන්නන්ට පිළිසරණ සැපයීම සම්බන්ධයෙන් නීති ප්‍රතිසංස්කරණවලට දායක වීම;
- යුක්තිය පසිඳලීම සහ යුක්තියට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීම උදෙසා දායකත්වය සැපයීම;

# පටුන


| | |
|---|---|
| දැක්ම...................................................................................................... | 01 |
| මෙහෙවර.................................................................................................. | 01-02 |
| පටුන....................................................................................................... | 03 |
| 1. ගරු සභාපතිතුමාගේ පණිවුඩය............................................................ | 04 |
| 2. ගරු අධක්ෂතුමාගේ පණිවුඩය | 05 |
| 3. හැඳින්වීම .............................................................................................. | 06-17 |
| 4. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකාරීත්වය හා කාර්ය මණ්ඩල .......... | 18-19 |
| 5. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අරමුදල් ........................................ | 20 |
| 6. පුහුණු වැඩසටහන් ........................................................................................ | 20-25 |
| 7. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය සාධනය........................................ | 26-27 |
| 8. 2020.01.01 වන දින සිට 2020.12.31 වන දින දක්වා කාලසීමාව සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ක්‍රියාකාරකම්...................................................... | 28-43 |
| 9. කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති............................................................................ | 44 |
| 10. 2020 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය .......................... | 45 |
| 11. 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය.................................................................................................... | 46-47 |
| 12. 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය.................................................................................................... | 48-49 |
| 13. 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය ............................................................................................ | 50 |
| 14. 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් | 53-58 |
| 15. අභියෝග.................................................................................................. | 59 |
| 16. ස්තුතිය.................................................................................................... | 60 |
| 1 වන පිරිශිෂ්ටය : විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන වාර්තාව...................................... | 61-66 |

## සභාපතිතුමාගේ පණිවුඩය

අග්‍රවිනිශ්චයකාර නිලමැදිරිය,
ශ්‍රේෂ්ඨාධිකරණය,
කොළඹ 12
ශ්‍රී ලංකාව.
ෆැක්ස් : ++94(01) 11 2437534
දුරකථනය : ++94(01) 11 2422142
විද්‍යුත් තැපැල: scjlib@sltnet.lk

2022 ඔක්තෝබර් මස 03 වනන දින

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සභාපති ගරු අග්‍රවිනිශ්චයකාරතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම ඉමහත් සතුටින් පිළිගනිමි. මෙම වාර්ෂික වාර්තාවෙන් 2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ඉටුකරන ලද වැඩ කොටස පිළිබඳව දැක්මක් ඉදිරිපත් කරයි. ලෝකයේ වෙනත් රටවල බොහෝ ආයතන විසින් අත්විඳි පරිදි ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ද කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිවිපාකවලට නතු වෙමින් සිය කාර්ය හා කර්තව්‍ය කරගෙන යාමේ පරිශ්‍රමයක නිරත විය. මෙම වසංගත තත්ත්වය නිසා අතාත්වික ලෝකයක් රඳෙමින් සිය කාර්ය හා කර්තව්‍ය කරගෙන යාමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට සිදු වූ අතර, එය අපගේ ජීවිතවල දෛනික ක්‍රියාකාරීවයේ නවතම සාමාන්‍ය තත්ත්වයක් බවට පත්විය. සිය වෘත්තියට හුරුවීමේ පුහුණුවීම් වැඩසටහන් MS භාවිතයෙන් මෙම කාලසීමාව තුළ දී ද නොකඩවාම සිදුකරන ලද බව අවධාරණයෙන් ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. මෙම ඉතාමත්ම වැදගත් පුහුණුවීම් වැඩසටහන් ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ මෙහෙයවීම උදෙසා උද්යෝගයෙන් කටයුතු කිරීම පිළිබඳව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අධ්‍යක්ෂතුමා, උපදේශකවරුන් සහ එහි කාර්යමණ්ඩලය මෙහි දී කෘතවේදීව සිහිපත් කරමි. මෙවැනි දරුණු වසංගතයක් පැවති කාලසීමාවක දී පවා අපගේ ඉලක්ක සාක්ෂාත් කරගැනීම පිණිස මෙම විස්තීර්ණ වගකීම නොපිරිහෙලා ඉටුකළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වෙත මගේ හදපිරි කෘතඥතාව පළකරමි. යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ශ්‍රී ලාංකික මහජනතාව වෙනුවෙන් සාධාරණව සහ කාර්යක්ෂමව ඉටුකිරීමට අධිකරණ නිලධරයන්ගේ කෞශල්‍ය සහ දැනුම නොකඩවාම ඉහළ නැංවීමට කටයුතු කිරීම අපගේ පොරොන්දුව සහ කැපවීම බවට පත්වී තිබේ.

අත්සන් කළේ/

ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය
අගවිනිසුරු

විනිශ්චයකාර නිලමැදිරිය,
ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය,
කොළඹ 12

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ගරු අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ අවසාන විගණන ගිණුම් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

මහාධිකරණ විනිශ්චයකාරවරුන්, අධිකරණ නිලධාරීන් සහ 2020 වර්ෂයෙහි අභිනවයෙන් බඳවාගන්නා ලද අධිකරණ නිලධරයන් වෙනුවෙන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පුහුණු වැඩසටහන් සහ පර්යේෂණ කටයුතු ගණනාවක්ම සිදුකරනු ලැබුව ද, මුළු ලොවම වෙළාගත් කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් එයින් බොහෝමයක්ම පවත්වන ලද්දේ ඔන්ලයින් තාක්ෂණය භාවිතයට ගනිමින්ය. අභිනවයෙන් බඳවා ගන්නා ලද අධිකරණ නිලධාරීන් උදෙසා කොවිඩ්-19 වසංගතය පැවති මුල් අවධියේ දී, ඔන්ලයින් තාක්ෂණයට හුරුවෙමින් ඉතාමත් ඵලදායී පුහුණු පාඨමාලාවක් පැවැත්වීමට අපට හැකිවිය.

එම වැඩසටහන්වලට මානව අයිතිවාසිකම් නීතිය, මිනිස් වෙළඳාම පිටුදැකීමේ සිදුවීම් සහ මුදල් විශුද්ධිකරණය පදනම් කරගත් අන්තරායකර මත්ද්‍රව්‍ය ආදී විෂයන් යටතේ පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන් ඇතුළත් විය. ඊට අමතරව, පරිගණක අපරාධ සහ විද්‍යුත් සාක්ෂි, ළමයින් සම්බන්ධ නඩු විනිශ්චය කිරීම පිණිස යොදා ගන්නා වැඩිම යහපත සලසන භාවිතයන් සහ මාර්ගෝපදේශ සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සඳහා පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය යන විෂයන් යටතේ වැඩමුළු සහ කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදී. අදාළ මාතෘකාවන් පිළිබඳව විනිශ්චයකාරවරුන්ගේ අත්දැකීම් බෙදා හදාගැනීම පිණිස එවැනි වැඩමුළු සමහරක් ආදර්ශ නඩු විභාග, සම්මන්ත්‍රණ සහ කණ්ඩායම් සාකච්ඡා වශයෙන් සකස් කරන ලදී. මීට අමතරව, විශේෂයෙන්ම මහාධිකරණ විනිශ්චයකාරවරුන් උදෙසා විදේශ වැඩමුළු ගණනාවක් ද පවත්වන ලදී.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ඉලක්ක සාක්ෂාත් කරගැනීම පිණිස සිය සහයෝගය, දැක්ම, අධිෂ්ඨානය සහ මාර්ගෝපදේශ ලබාදීම සම්බන්ධයෙන් එම ආයතනයේ සභාපති ගරු අගවිනිසුරුතුමාටත්, එමෙන්ම එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ගරු කටයුතු සමාජිකයන්ටත් ස්තූතිය පිරිනැමීම පිණිස මෙය අවස්ථාවක් කර ගනිමි.

තව ද, මෙම ඉලක්ක සපුරා ගැනීම පිණිස අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා, එහි කාර්ය මණ්ඩලය විශේෂයෙන්ම අධිකරණ අමාත්‍යාංශයේ පරිපාලන සහ ගිණුම් කටයුතු භාරව කටයුතු කරන නිලධාරීන් විසින් ඉමහත් කැපවීමෙන් ලබාදුන් සහයෝගය වෙනුවෙන් මාගේ කෘතඥතාව පළකරමි.

අවසන් වශයෙන්, දැඩි ලෙස සේවයට කැප වීමේ උත්සාහයක නිරත වෙමින් ලබාදුන් අගනා සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ කාර්යමණ්ඩලයට ද මාගේ කෘතඥතාව මෙයින් පළකර සිටිමි.

අත්සන් කළේ/
විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ

# හැඳින්වීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද "1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනත" මඟින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවන ලදී. විනිශ්චයකාරවරයන්ගේ ආයතනයක් පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද මෙම පනතින් විධිවිධාන සලස්වා ඇත.

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පරමාර්ථ

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමේ පරමාර්ථ පහත දැක්වේ.

1. අධිකරණ නිලධරයන් විසින් අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් ස්වකීය මතයන් සහ අදහස් හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැලැස්වීම;

2. අධිකරණ නිලධරයන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරීමේ අදහසින් රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධාන කිරීම සහ පැවැත්වීම;

3. යුක්තිය පසිඳලීම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණුවීම් සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරීම සහ පැවැත්වීම;

4. අධිකරණ නිලධරයන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයීම.

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ආයතනයේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ අධිකරණමය අධ්‍යාපනය සහ පුහුණුවීම් මෙන් ම ඔවුන්ගේ වෘත්තීමය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ශ්‍රී ලංකාව තුළ තනි හා එකම අධිකරණමය ආයතනය වශයෙන් වඩාත් දුර්ලභ ඝණයේ සුවිශේෂිත්වයක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධරයන් සඳහා අධිකරණ විෂය පිළිබඳව හැදෑරීමට අවකාශ සැලසීමේ දී, විනිශ්චයාසනය හොබවන විනිශ්චයකාරවරයා සමීපයෙහි අසුන් ගෙන සති කිහිපයක් පුරාවට අධිකරණ ශාලාවේ කටයුතු නිරීක්ෂණය කිරීම වනාහී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමට පෙර කාලයේ දී අලුත් පත්වීම් ලද අධිකරණ නිලධරයන් අධිකරණ රාජකාරිවල වැඩ බාර ගැනීමට පෙර ලැබූ එකම පුහුණුව බවට පත්ව තිබුණි. යුක්තිය පසිඳලීම කරන විනිශ්චයකාරවරයන් ස්වකීය අධිකරණ වෘත්තිය ආරම්භ කිරීමට පෙරාතුව පමණක් නොව, ස්වකීය අධිකරණ වෘත්තිය නියැලෙන සමස්ත කාලය පුරාම පුහුණුවීම් ලබාගත යුතු බවට දැඩි ලෙස විශ්වාස කරනු ලැබේ. ඒ අනුව, සියලුම මට්ටමේ අධිකරණ නිලධරයන් සඳහා නිතිපතා පුහුණුවක් ලැබෙන අන්දමට වෙන් වූ පරිපූර්ණ සහ අඛණ්ඩ පුහුණු ආයතනයක් සැලසුම් කොට පිහිටුවීම කළ යුතු බවට ඉක්බිතව අවබෝධ කර ගන්නා ලදී.

විනිශ්චයකාරවරයන් සඳහා ආයතනයක් පිහිටුවීම පිළිබඳ අදහස මුල්වරට සාකච්ජාවට භාජනය කළේ එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධුරය හෙබ වූ පී.බී.හේරත් මහතා විසිනි. ප්‍රංශය තුළ ක්‍රියාත්මක වන එවැනි ආයතනයක් සියැසින් දැක බලා ගැනීමෙන් අනතුරුව 1982 වර්ෂයේ දී ඒ පිළිබඳව එතුමා විසින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ පුවත්පත් සඟරාවකට පුවත් ලිපියක් ලියන ලදී. නමුත්, සුපුරුදු ලෙස ඒ සම්බන්ධයෙන් කිසිවක් සිදු නොකරන ලද අතර, එම කාරණය සාකච්ජාවට භාජනය කළ ද, ඊට ප්‍රමාණවත් ඇහුම්කන් දීමක් සිදු නොවීය. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයකු වශයෙන් ක්‍රියා කරමින් විනිශ්චයකාරවරයන්ගේ ආයතනයක් පිහිටුවීම පිළිබඳව පළමු වරට සාකච්ජා කළ පී.බී.හේරත් මහතා එකී ආයතනය පිහිටුවීම දිරිමත් කිරීමේ ස්ථිරසාර ප්‍රබල මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියා කළ අතර, ආයතනයේ ප්‍රබලතම මට්ටමේ හිතෛෂී කොටස්කරුවෙකු බවට පත් විය.

ඒ අනුව, විනිශ්චයකාරවරුන් සඳහා සේවාස්ථ අඛණ්ඩ නීති අධ්‍යාපනයක් සැපයීම පිණිස විනිශ්චයකාරවරයන් සඳහා වන ආයතනයක් පිහිටුවීම පිණිස ඔහු විසින් ක්‍රියා කළ අතර, ගරු විනිසුරු ජේ.එෆ්.ඒ.සෝසා මැතිතුමා 1984 මැයි මස 02 වන දින ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත්කරන ලදී. අරමුදල් සැපයීම පිළිබඳ ගැටලුව ආසියානු පදනමේ නේවාසික නියෝජිත ජෝන් ගුයේ මහතා සමඟ ඒ වන විටත් සාකච්ජා කර තිබුණි. ආයතනය පිහිටුවීම පිණිස පළමුවෙන් ම කළ යුතුව තිබුණේ ඊට උචිත පරිශ්‍රයක් සොයා බලා තෝරා ගැනීමයි. ඒ අනුව, විවිධ විකල්ප පරිශ්‍රයන් හඳුනා ගැනීමෙන් පසුව, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උප ගෘහය වසරක කාලයක් සඳහා බද්දට ගන්නා ලද අතර, ඊට අවශ්‍ය ගෘහභාණ්ඩ සැපයීමට ද කටයුතු කරන ලදී. මෙම සියලු ම කටයුතු ආසියානු පදනමේ මුල්‍ය අනුග්‍රහය හරහා සිදු විය. ඉන් අනතුරුව සමහරක් සම්මන්ත්‍රණ පවත්වන ලද නමුත්, රජයේ අනුමැතිය ලබාගත යුතු බැවින්, අවස්ථාවෝචිත පරිදි පමණක් වැඩසටහන් දියත් කරන ලදී. අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලද නමුත්, රජයේ අනුමැතිය ලබාගත හැකිවේ ද යන්න පැහැදිලි කාරණයක් නොවීය.

අද්විතීය මට්ටමේ දේශන සමහරක් පවත්වන ලද අතර, එම කතිකාවන් ඉතාමත් ඉහළ මට්ටමේ ප්‍රමිතියකින් යුක්ත ඒවා විය. මෙම දේශනවල ආරාධිත දේශකයා බවට පත් වූයේ ගරු විනිසුරු ක්ලිෆර්ඩ් වොලස් මහතා වූ අතර, එතුමා නීති ක්‍රම හා අධිකරණ පරිපාලනය පිළිබඳ ආසියානු පදනමේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයා වූ අතර, එක්සත් ජනපදයේ අභියාචනාධිකරණයේ අධිකරණ මණ්ඩලයේ නවවන කීර්තිධර විනිශ්චයකාරවරයා ද විය.

ඒ අනුව, විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සමාරම්භය එලෙසින් සිදු විය. විශිෂ්ඨ ගණයේ බුද්ධිමතකු සහ පරිකල්පනයේ අද්විතීය මිනිසෙකු වූ ගරු ආචාර්ය ඒ.ආර්.බී අමරසිංහ මැතිතුමා ආයතනයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට සැදී පැහැදී උර දී සිටීම භාග්‍යයක් විය. ඔහුගේ නාමය විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රභවය සම්බන්ධයෙන් අවධාරණය කළ යුතු වන්නේ ඔහු විසින් දරන ලද උත්සාහයේ ප්‍රතිඵලය 1985 නොවැම්බර් මස 20 වන දින සහතිකය සටහන් කරන ලද 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පාර්ලිමේන්තුව විසින් පනතක් මඟින් පනවනු ලැබීම නිසාය. ගරු විනිසුරු සෝසා මැතිතුමා ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් 1986 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධිමත් ලෙස පත් කරන ලදී. එතැන් පටන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණුවීම් සහ උපදේශාත්මක සේවාවන් සැපයීම හරහා අධිකරණ නිලධරයන් සඳහා හැකි සෑම අවස්ථාවක දී ම, සේවය කර ඇත. තව ද, 1990 වර්ෂයේ දී, විනිසුරු ගරු කේ. විග්නරාජා මැතිතුමා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් ද, පී. නෙවිල් ඒ ද සිල්වා මහතා අගවිනිසුරු ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම යාමෙන් ඉක්බිතිව ආයතනයේ ලේකම්වරයා වශයෙන් ද, සම්බන්ධ වීමෙන් ගරු විනිසුරු සෝසා මැතිතුමාට සහාය ලබා දීම ද විශේෂයෙන් අගය කළ යුතුය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් අතුරින් පත් කරන ජ්‍යෙෂ්ඨ ම විනිශ්චයකාරවරයන් දෙදෙනෙකු සහ නිල බලයෙන් ගරු අග්‍රවිනිශ්චයකාරවරයා සභාපති ධූරය හොබවන කළමනාකරණ මණ්ඩලයක් මඟින් විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පාලනය වේ. ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය, කළමනාකරණ මණ්ඩලය වෙත පවරන ලදී.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ පළමු සභාපතිවරයා වූයේ එකී ආයතනය වෙත ඉමහත් උද්යෝගයකින් සහාය පළකළ හිටපු අගවිනිසුරු ගරු එස්. ෂර්වානන්ද මැතිතුමාය. ඉක්බිතිව අග්‍රවිනිශ්චයකාර ගරු පාරින්ද රණසිංහ මැතිතුමා කලමනාකරණ මණ්ඩලයේ සභාපති ධූරයට පත්විය. එතුමා අධිකරණයේ ම සාමාජිකයකු වූ අතර, ආයතනයේ කටයුතුවල දී ස්වකීය අවංක අගනා කැපවීම ප්‍රදර්ශනය කළේය. එතුමා ආයතනයේ සියලු ම සම්මන්ත්‍රණ සහ ක්‍රියාකාරකම්වලට සහභාගී විය. එතුමා විසින් මෙම සම්මන්ත්‍රණවල දී නීතිඥවරුන් සහ මිනින්දොරුවරුන් සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, ගරු විනිශ්චයාසනය සහ නීතිඥ සංගමය අතර සුහද සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම පිණිස අධීක්ෂණ කමිටු ද පිහිටුවන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය තුළ ඔහු සැමදා මතකයේ රැදෙනු ඇත.

ඉන් පසුව, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ඒ වන විටත් එහි සේවය කර තිබූ අග්‍රවිනිශ්චයකාර ගරු තම්බයියා මැතිතුමා කළමනාකරණ මණ්ඩලයේ සභාපති ධූරයට පත් කරන ලද අතර, ඔහු විසින් ආයතනයේ ප්‍රගතිය සහ අභිවෘද්ධිය වෙනුවෙන් ඉතාමත් අගනා වැදගත් දායකත්වයක් ඉටු කරන ලදී. එවකට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ ඒ. එස්. විජේතුග මහතා ආයතනයේ පරමාර්ථ සඵල කර ගැනීම පිණිස දැඩි උත්සාහයක් දරමින් ප්‍රමුඛ පෙළේ අනගිභවනීය කාර්ය භාරයක් ඉටු කරන ලදී. අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුවරයා වශයෙන් කටයුතු කළ අවධියේ දී, ඔහු විසින් ආයතනයට ඉටු කළ චිරස්ථායී මෙහෙවර තවමත් ප්‍රකටය. එතුමාගේ අනුප්‍රාප්තිකයා බවට පත් වූයේ ලාල් පීරිස් මහතාය. ඔහුට සහාය වූ එස්. විතානාරච්චි මහතා විසින් ද ආයතනයේ අභිවෘද්ධිය සහ දියුණුව පතා නොපසුබට මෙහෙවරක යෙදුණේය. ආයතනයේ සුභසිද්ධිය උදෙසා ඔවුන් විසින් අභිලාෂවත් සැලකිල්ලක් දක්වා ඇති අතර, ඔවුන් ආයතනයට වැරගැන්වූ ශක්තිමත් ටැඹක් වුවාට නිසැකය.

කලින් ජෝන් ගුයර් මහතා ප්‍රධානත්වය හෙබ වූ ද, ඉන්පසුව නික් ලැන්ග්ටන් මහතා ප්‍රධානත්වය හෙබවූ ද, ආසියානු පදනමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සිය ස්තුතිය මෙහි දී පළකර සිටිනු ලැබේ. ආයතනයේ වර්තමාන මනා තිරසාර පැවැත්ම උදෙසා ආසියානු පදනම විසින් ලබා දුන් අගනා සහයෝගයට අයතනයේ නොමඳ කෘතඥතාව හිමි විය යුතුය. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වනාහී ප්‍රමුඛත්වයෙහි ලා සැළකිල්ලට භාජනය කළ යුතු ආයතනයක් වන අතර, පදනමේ ත්‍යාගශීලිත්වයේ අර්ථලාභියෙකු වන බවට ප්‍රකාශ කරන්නේ ඉතාමත් සාඩම්බරයෙනි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ

ආයතනය ඉන්පසු අවස්ථාවක අළුත්කඩේ පිහිටි ශ්‍රේෂ්ඨාධිකරණයේ පරිශ්‍රයක පිහිටුවන ලද අතර, නඩත්තු කිරීමේ වියදම් රජය විසින් දරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් නඩු විභාග කරන විනිශ්චයාධිකාරවරයන් සඳහා පුහුණු වැඩසටහන් සකස් කිරීමේ දී, අධිකරණමය කාරණාවන් සම්බන්ධයෙන් වන විටක දී අභියාචනා අධිකරණ බලය ඇති අධිකරණවල ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරයන්ගේ විශේෂඥතාව සහ පළපුරුද්ද ද, පරිපාලනමය කාරණාවන් සම්බන්ධයෙන් වන විටක දී, අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහයෝගය ද ලබාගෙන ඇත. 1990 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී කැලිෆෝනියාවේ පිහිටි අධිකරණ අධ්‍යාපනය සහ පර්යේෂණ මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පෝල් එම්. ලී මහතා ශ්‍රී ලංකාවට ගෙන්වා අධිකරණ විෂය සම්බන්ධයෙන් විස්තීර්ණ අධ්‍යාපනික පුහුණු ක්‍රමවේදයක් තෙවසරක නියමු පදනමින් ලබාදීමට ශ්‍රී ලංකා විනිශ්චයකාරය්වරයන්ගේ ආයතනයට හැකිවීම පිණිස ව්‍යාපෘතියක් සකස් කරන ලදී. එම ව්‍යාපෘතියේ සුවිශේෂී අංග ලක්ෂණ පහත දැක්වේ.

1. ශ්‍රී ලංකාවේ අධිකරණයට අලුතින් පත්වන අධිකරණ නිලධරයන්ගේ අධිකරණමය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සහ කෞශල්‍යය යාවත්කාලීන කොට ප්‍රගුණ කර ගනිමින් ඉදිරියටත් ස්වකීය අධ්‍යාපනය නොකඩවා ම කරගෙන යාම පිණිස අර්ධ වාර්ෂික වෘත්තීය අධ්‍යාපන වැඩසටහන හඳුන්වා දීම;

2. දිසා අධිකරණ සහ මහාධිකරණවලට අලුතෙන් උසස්වීම් ලබන විනිශ්චයාධිකාරවරයන් සඳහා වෙන් වෙන් වූ, මාසික සේවාස්ථ සමාරම්භක වැඩසටහන් දියත් කිරීම;

3. නව නෛතික ප්‍රවනතාවන්, පොදු සහ සුවිශේෂී අධිකරණ ගැටලු විසඳීම සහ දේශීය අධිකරණ පරිචයන්, කාර්ය පටිපාටි ප්‍රමිතිගත කිරීම පිළිබඳ නූතනමය අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සකස් කිරීමේ දී පිළිවෙලින් මහේස්ත්‍රාත්වරයන්ට, දිසා විනිසුරුවරයන්ට, මහාධිකරණ විනිශ්චයකාරවරයන්ට, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන්ට සහාය ලබා දීම පිණිස වාර්ෂික සේවාස්ථ අඛණ්ඩ අධ්‍යාපන සම්මේලන පැවැත්වීම;

4. අධිකරණ කළමනාකරණය, සන්නිවේදන කෞශල්‍යය, කාන්තාවන් සහ සුළු ජනවාර්ගික කොටස් සඳහා අධිකරණ ශාලාව තුළ සාධාරණත්වය ඉටු කිරීම, අධිකරණ විෂය ගවේෂක තීරණ ගැනීම සහ නීති ශාස්ත්‍රය, මනුෂ්‍යත්වය, පවුල් නීතිය, ළමා අධිකරණ නීතිය, අපරාධ නීතිය, සිවිල් නීතිය, ප්‍රොබේට් සහ මානසික සෞඛ්‍යය පිළිබඳ නීතිය, ඉඩම් සහ බෙදුම් නඩු නීතිය මෙන් ම මානව අයිතිවාසිකම් පිළිබඳ නීතිය වැනි ඉතා වැදගත් අධිකරණ විෂයයන් පිළිබඳව කාලීනව සති එකක උසස් අධිකරණ අධ්‍යාපන වැඩ සටහන් හඳුන්වා දීම;

5. ශ්‍රව්‍ය සහ දෘශ්‍ය වශයෙන් පටිගත කළ අධ්‍යාපන කරුණු (අධිකරණවල දී, විනිශ්චයකාරවරයන් සඳහා මූලික පුස්තකාල පහසුකම්) ඇතුළුව අධිකරණ සඳහා විස්තීර්ණ දෛනික වැඩ මෙවලම් අංග (විනිශ්චයාසන පොත්, කතිත වචනයෙන් සහ ලිඛිත ආකාරයෙන් පරීක්ෂණ ලැයිස්තු, අත්පොත් සහ වෙනත් පරිශීලන පොත්පත්) හඳුන්වා දීම;

6. විනිශ්චයකාර ගුරු ඇදුරන් සඳහා කාර්යක්ෂම අධිකරණ පීඨ සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම;

7. අධිකරණ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට, අධිකරණ නඩු ප්‍රමාදය මැඩලීමට සහ විනිශ්චයකාරවරයන් සඳහා ආචාර විද්‍යාත්මක පැවැත්ම සහ මහජන වගකීම් වැඩිදියුණු කිරීමට සිදු කරන පර්යේෂණ, ඉඩම් සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම;

8. යථෝක්ත අධිකරණ ක්‍රමය දියත් කිරීම පිණිස සුදුසු පංති කාමර, කාර්යාල, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සහ වෙනත් සම්පත් සහිත අධිකරණ පීඨ සැලසුම් කිරීම, කුලියට ගැනීමේ හැකියාව සලකා බැලීම හෝ අනාගතයේ දී ඉදිකිරීමට පියවර ගැනීම;

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ යුක්තියේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ නීතියේ ආධිපත්‍ය සවිබල ගැන්වීමයි. මක්නිසාද යත්, සාධාරණ, වේගවත් සහ කාර්යක්ෂම ලෙස යුක්තිය පසිඳලීම පිණිස අධිකරණයේ සාමාජිකයන් තමන්ට පැවරී ඇති භූමිකාව සහ වගකීම් ඉටු කිරීමට මැනැවින් සන්නද්ධ වී

සිටීම අවශ්‍ය වේ. මෙම අරමුණු සඵල කර ගැනීම පිණිස අලුතින් පත්වීම් ලබන විනිශ්චයකාරවරුන්ට සිය ධුරවල වැඩ භාර ගැනීමේ දී විධිමත් පුහුණුවක් ලබාදීම අවශ්‍ය වනවාක් මෙන් ම ඔවුන් සිය ධුරය හොබවන සමස්ත වෘත්තීය කාලය පුරාම සිය අධ්‍යාපනය නොකඩවා ම කරගෙන යාම අවශ්‍ය වේ. යුක්තියේ ගුණාත්මකභාවය විනිශ්චයකාරවරයන් කොපමණ ප්‍රමාණයකට යහපත් මට්ටමින් සිටින්නේ ද යන කාරණය මත රඳා පවතී. නීතිය තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. පසිඳලන යුක්තිය එය පසිඳලන විනිශ්චයකාරවරයා යහපත් තරමට ම යහපත් විය යුතුය. නීතියේ ආධිපත්‍යයට කැපවී සිටින ලෝකයේ සියලු ම රටවල් මෙම තත්ත්වය වටහාගෙන තිබෙන අතර, විනිශ්චයකාරවරයන් සඳහා පුහුණු වීම් සහ අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ.

මෙම කාල පරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ශ්‍රේෂ්ඨාධිකරණ පරිශ්‍රයේ අංක 1308 දරන කාමරයේ ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු වූ ගරු කේ. විග්නරාජා මැතිතුමා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලද අතර, එතුමා විසින් ගරු විනිසුරු ජේ.එෆ්.ඒ.සෝසා මැතිතුමා සමඟ එක්ව අධිකරණ නිලධරයන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ගරු කේ. විග්නරාජා මැතිතුමා ආයතනයේ සිය ධුරයෙන් නික්ම ගිය ඉක්බිතිව, අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකු වූ ගරු එස්.ජේ.ඩී.ද එස්. විජේරත්න මැතිතුමා 1986 වර්ෂයේ දී ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් වැඩ භාරගන්නා ලදී. ඉන්පසුව, අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු වූ ගරු පී.එච්.කේ.කුලතිලක මැතිතුමා 2002 වර්ෂයේ දී ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ සාමාජිකයකු වශයෙන් ද, මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද, කටයුතු කිරීමෙන් ඉක්බිතිව එතුමා ලබා තිබූ හසල දැනුම සහ පළපුරුද්ද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මහඟු සම්පතක් වූ අතර, එතුමා අධිකරණ නිලධරයන්ට ගුරු ඇදුරුතුමෙකු විය.

අගවිනිසුරුවරයකු වූ ගරු ජී.පී.එස් ද සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව, ගරු විනිසුරු සරත් එන්. සිල්වා මැතිතුමා 2000 වර්ෂයේ දී, අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කරන ලදී. අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ප්‍රගමනයේ දී වැරගැන් වූ සවිමත් ටැඹක් බවට පත්විය. කොළඹ 07, විජේරාම මාවතේ පිහිටි එතුමාගේ නිල නිවාසය විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වශයෙන් භාවිතා කිරීමට එතුමා විසින් අවසර ප්‍රදානය කරන ලද අතර, අධිකරණ නිලධරයන් සඳහා වන පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම පිණිස නීති සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ අරමුදල් ලබාගැනීමට අවස්ථාව උදාකර දෙන ලදී.

ලෝක බැංකුවේ සහයෝගීතාව ඇතිව අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ නීති සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සහයෝගිතාව සහිතව අධිකරණ නිලධරයන් සඳහා විදේශීය ශිෂ්‍යත්ව ක්‍රමය ආරම්භ කිරීම මඟින් ගරු අගවිනිසුරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් දිගුකාලීන අධිකරණ පුහුණු වැඩසටහන ආරම්භ කිරීමට මුල පිරීය. කාර්යක්ෂමය සහ ප්‍රවීණත්වයකින් යුතුව ආරවුල් විසඳීමට හැකි නූතන අධිකරණ පද්ධතියක් පිහිටුවීම මෙම ව්‍යාපෘතියේ එක් අරමුණක් බවට පත් වී තිබුණි. වානිජ නීතිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් අලුතින් පත්වීම් ලද සහ සේවාස්ථ විනිශ්චයකාරවරයන් යන දෙකොටස ම ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම සහ විස්තීරණ පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ ඒකාබද්ධ අංගයක් විය. මෙම ඉලක්කය සාක්ෂාත් කරගැනීම පිණිස වසරකට අධිකරණ සාමාජිකයන් තිදෙනෙකුට එල් එල් එම් උපාධිය ලබා ගැනීම සඳහා සමස්ත අධ්‍යයන පිරිවැය සඳහා එනම්, උපකාරක පංති, ප්‍රවාහන වියදම්, නවාතැන් පහසුකම් සහ සාධාරණ යැපුම් දීමනාවක් සඳහා මෙම ව්‍යාපෘතියෙන් අරමුදල් සම්පාදනය කරන ලදී.

අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් අධිකරණ නිලධරයන් සහ උසාවි කාර්ය මණ්ඩලය සඳහා පරිගණක පුහුණු වැඩසටහනක් එවකට කොළඹ 07 විජේරාම මාවතේ පිහිටි එතුමාගේ නිල නිවසේ දී ආරම්භ කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ දී අධිකරණ අමාත්‍යාංශය විසින් නව ගොඩනැගිල්ලක් ඉදි

කරන ලද අතර, ඒ අනුව, විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා එම ගොඩනැගිල්ලේම 5 වන මහල ද, 4 වන මහලේ කොටසක් විනිශ්චයකාරවරයන්ගේ නවාතැන් ගැනීම සඳහා ද, වෙන් කරන ලදී. අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් ආයතනයට ලබාදුන් අනුග්‍රහය පිළිබඳව ආයතනය විසින් සිය කෘතඥතාව පළකර සිටින අතර, අග්‍රවිනිශ්චයකාර ධුරය හෙබ වූ 2000 සිට 2009 වර්ෂය තුළ ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් එතුමා විසින් අවංක සේවාවක් ඉටු කරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සැම විටක දී ම එතුමා ගෞරවයෙන් සිහිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ආරම්භක අධ්‍යක්ෂවරයා වූ විනිසුරු ගරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමා ආයතනයෙ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් වසර 21 ක අගනා සේවයකින් පසුව වර්ෂ 2008 වර්ෂයේ දී විශ්‍රාම ගන්නා ලදී. එතුමා විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මෙන් ම අධිකරණ නිලධරයන් සඳහා ද ප්‍රශංසනීය සේවාවක් ඉටු කරන ලද අතර, එතුමාගේ මෙහෙවර සදාකාලිකව අපගේ මතකයේ රැඳෙනු ඇත.

ගරු විනිසුරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු වූ ගරු නිශ්ශංක උදලාගම මැතිතුමා 2008 වර්ෂයේ දී ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, එතුමා 2011 වර්ෂය වන තෙක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් සිය රාජකාරී කටයුතු ඉටු කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ ගරු විනිසුරු නිශ්ශංක උදලාගම මැතිතුමා විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පළමු වෙබ් අඩවිය ආරම්භ කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ මහාධිකරණවල විනිශ්චයකාරවරයන්ගේ සහයෝගීතාව ඇතිව අධිකරණ නිලධරයන් සඳහා අපරාධ, සිවිල්, වානිජ කාරණාවන්, නඩු කළමනාකරණය සහ ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම පිළිබඳ පාඨමාලා ග්‍රන්ථ 10 කට අධික ප්‍රමාණයක් පළ කිරීමේ දී, ගරු විනිසුරු ජේ. එෆ්.ඒ.සෝසා මැතිතුමා, ගරු විනිසුරු උදලාගම මැතිතුමා සහ ගරු විනිසුරු පී.එච්.ඒ.කුලතිලක මැතිතුමා විසින් අතිශයින් ම ඵලදායී කර්තව්‍යයක් ඉටු කරන ලදහ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙනුවෙන් ඔබලා විසින් කළ මෙහෙවරට අප සිය හෘදයාංගම ප්‍රණාමය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නෙමු.

අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව, විනිසුරු ගරු අශෝක ද සිල්වා මැතිතුමා 2009 වර්ෂයේ දී අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කරන ලදී. එතුමාගේ ධුර කාලයේ දී විනිසුරු ගරු පී.එච්.ඒ.කුලතිලක මැතිතුමා 2009 වර්ෂයේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදී. 2011 වර්ෂයේ දී එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් ගරු විනිසුරු ටී. බී. වීරසූරිය මැතිතුමා සමඟ සම- අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදී. ගරු විනිසුරු ටී. බී. වීරසූරිය මැතිතුමා සහ ගරු විනිසුරු ගරු පී.එච්.කේ. කුලතිලක මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් අගනා සේවයක් සිදු කරන ලද අතර, ඔවුන් උපරිමාධිකරණවල සේවය කිරීමෙන් ලත් අගනා පළපුරුද්ද සහ හසල දැනුම උපයෝගී කර ගනිමින් සිවිල් සහ අපරාධ අධිකරණවල සේවය කරන විනිශ්චයකාරවරයන් පුහුණු කිරීමට අගනා මෙහෙවරක් ඉටු කර ඇත. ශ්‍රී ලංකාවේ විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මෙන් ම අධිකරණයට ඔවුන් විසින් ඉටු කළ සුවිසාල සේවය නිසා එතුමන්ලා වෙත බුහුමන් ප්‍රණාමය පුද කිරීම පිණිස ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය මෙය විශේෂ අවස්ථාවක් කොට ගනියි. අප විසින් එතුමන්ලා අපගේ කෘතහස්ත ගුරු ඇඳුරන් වශයෙන් සැම විටක දී ම සිහියට නැඟිය යුතුව ඇත.

අග්‍රවිනිශ්චයකාර ගරු අශෝක සිල්වා මැතිතුමා අධිකරණ විෂය පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුවීම් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළේය. අග්‍රවිනිශ්චයකාර ගරු අශෝක ද සිල්වා මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සහාය ලබාගෙන පුහුණු වැඩසටහන් සහ පුහුණුවල අන්තර්ගත කරුණු ප්‍රතිව්‍යුහගත කිරීමට ක්‍රියා කළේය. මහාධිකරණ විනිසුරන් සහ අධිකරණ නිලධාරීන් වෙනුවෙන් වැඩ මුළු ගණනාවක් පවත්වන ලදී. ඒ අනුව, එතුමා සම්මන්ත්‍රණ ගණනාවකට පෞද්ගලිකව ම සහභාගී වී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කටයුතුවලට සහාය ලබාදුණි. මෙම කාලයේ දී පුහුණු අත්පොත් ගණනාවක් පළකරන ලද අතර, අධිකරණ පුහුණුවීම් පවත්වාගෙන යාම පිණිස සම්පත් දායකයන්

වශයෙන් තත්කාලයේ සේවයේ නිරත විනිශ්චයකාරවරයන්ගේ මෙන් ම විශ්‍රාමික විනිශ්චයකාරවරයන්ගේ සේවාව ලබා ගැනීමට ද අග්‍රවිනිශ්චයකාරවර ගරු අශෝක සිල්වා මැතිතුමා කටයුතු කළේය. පුහුණුව අවශ්‍ය වන විනිශ්චයකාරවරුන් පුහුණු කිරීම පිණිස මහාධිකරණ විනිසුරුවරුන්ට ආරාධනා කරන ලෙස ගරු අගවිනිසුරු අශෝක සිල්වා මැතිතුමා ආයතනයට උපදෙස් දුන්නේය.

මෙම කාලයේ දී ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කරන ලදී. නව ශ්‍රවණාගාරයක්, පරිගණක විද්‍යාගාරයක්, පුස්තකාලයක් සහ විනිශ්චයකාරවරයන් සඳහා නේවාසිකාගාර සහිතව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමට අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධයෙන් එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කළ සුහද ගම්ලත් මහතාට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සිය කෘතඥතාව පළකර සිටියි. එබැවින් අධිකරණ නිලධරයන් සඳහා නව විනිශ්චයකාරවරයන්ගේ ආයතනයක් ලබාදීමට එතුමා දරන ලද උත්සාහය පිළිබඳව ආයතනය විසින් නිබඳව ම සිය මතකය අවධි කරයි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා අවශ්‍ය පරිගණක විද්‍යාගාරය, ශ්‍රවණාගාරය, පුස්තකාලය සහ ගෘහ භාණ්ඩ ඇතුළු සියලු ම උපකරණ සැපයීමට ක්‍රියා කිරීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සිය ගෞරවය ප්‍රදානය කර සිටියි.

අග්‍රවිනිශ්චයකාර ගරු අශෝක ද සිල්වා මැතිතුමා විශ්‍රාම ගැනීමෙන් පසුව ගරු විනිසුරු ශිරාණි ඒ. බණ්ඩාරනායක මැතිණිය 2011 වර්ෂයේ දී අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කරන ලද අතර, එතුමිය ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිනිය ලෙස පත් වූවාය. ගරු විනිසුරු ටී.බී.වීරසූරිය මැතිතුමා සහ ගරු විනිසුරු පී.එච්.කේ.කුලතිලක මැතිතුමා ද, 2012 මැයි මාසය වන තෙක් ආයතනයේ සම අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළහ. ඉන් අනතුරුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් මහාධිකරණ විනිසුරු ධුරය හොබවමින් සිටි ගරු රුවන් ප්‍රනාන්දු මැතිතුමා 2012 ජූනි මාසයේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, මහේස්ත්‍රාත්වරයකු වශයෙන් කටයුතු කරන මහී විජේවීර මැතිතුමා ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරක වශයෙන් පත් කරන ලදී.

අග්‍රවිනිශ්චයකාර ගරු ශිරාණි ඒ. බණ්ඩාරනායක මැතිණිය විසින් ප්‍රධානත්වය දරන ලද කළමනාකරණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කටයුතු සඳහා සහයෝගය ලබා දුන් අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අභිවෘද්ධිය පතා ඉතා වැදගත් දායකත්වයක් සපයන ලදී. මෙම කාලයේ දී, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ගණකාධිකාරීවරයා වැඩ බැලීමේ පදනම මත ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී. එමෙන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස අධිකරණ රෙජිස්ට්‍රාර්වරයකු සහ කළමනාකරණ සහකාරවරුන් තිදෙනෙකු ද පත් කරන ලදී. එවකට අධිකරණ අමාත්‍යාංශයේ සේවයේ නියුතුව සිටි කණිෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට පත් කිරීමට කටයුතු කළ එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධුරය හෙබවූ සුහද ගම්ලත් මහතාට ද, මෙහි දී ආයතනය විසින් සිය කෘතඥතාවය පළකර සිටියි. 2012 වර්ෂයේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය රෙගුලාසිවලට යටත්ව ආදායම සහ වියදම සම්බන්ධයෙන් බලය අභිනියෝජනය කිරීම පිණිස අනුමැතිය ද ලබාගෙන ඇත. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සිය වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. එමෙන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සේවක සංඛ්‍යාව සකස් කරන ලද අතර, ආයතනයේ පුහුණු වැඩසටහන් කමිකරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරු දක්වා ව්‍යාප්ත කරන ලදී. එමෙන් ම, මනාව සංවිධිත නූතන පුහුණු වැඩසටහන් සහ පර්යේෂණ පහසුකම් සහිත ආයතනයක් බවට පත් කිරීම පිණිස මෙම කාලයේ දී පුහුණු වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කරන ලද අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පහසුකම් නවීකරණය කිරීමට ද පියවර ගන්නා ලදී.

මෙම කාලයේ දී ආයතනයේ ලේකම් කාර්යාලය පිහිටුවීම පිණිස සුදුසු ස්ථානයක් සොයා ගැනීම, පුහුණු වැඩ සටහන් ව්‍යාප්ත කිරීම, *Wi-Fi* පහසුකම් සඳහා මනාව සැදුම්ලත් පරිගණක විද්‍යාගාරයකින් සංගෘහිත පුස්තකාලයක් පිහිටුවීම පිණිස පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායනයේ (ICTA) සහාය ඇතිව වෙබ් අඩවිය නැවත සක්‍රීය කිරීම, උපරිමාධිකරණවල වාර්තා නොකළ නඩු තීන්දු රැස්කිරීම, විනිසුරුවරයන් සඳහා ආයතනය තුළ නේවාසික පහසුකම් ලබාදීම, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ඉල්ලීමට අනුව අධිකරණ නිලධරයන් සඳහා පුහුණු අත්පොතක් වැඩිදියුණු කිරීම පිණිස වැඩ කටයුතු ආරම්භ කිරීම, අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, පරිගණක සර්වරය වැනි අවශ්‍ය භෞතික සම්පතක් සැපයීම, පරිගණක මුද්‍රිත පිටපත් සහ ඡායා පිටපත් පහසුකම් ආරම්භ කිරීම සහ රාජ්‍ය පරිපාලන සහ මුල්‍ය චක්‍රලේඛවල නියමයන්ට අනුකූලව පරිපාලන කාරණාවන් සම්බන්ධව ක්‍රියාකිරීම සඳහා ප්‍රමුඛස්ථානය ලබාදීම සිදුවී ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය මේ සම්බන්ධයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වෙත සිය ප්‍රණාමය පළ කර සිටින අතර, මේ සම්බන්ධයෙන් ඉටු කළ සේවය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ අධ්‍යයන සම්බන්ධීකාරක මහී විජේවීර මහතාට මෙන් ම ආයතනයේ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් කටයුතු කළ ඥානපාල මහතා ඇතුළුව ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලයට සිය අවංක කෘතඥතාවය පළ කර සිටිනු ලැබේ.

2013 ජනවාරි මාසයේ දී ගරු මොහාන් පීරිස් මැතිතුමා ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කිරීමෙන් අනතුරුව, එතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා බවට පත්විය. අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා මුල පටන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කටයුතුවලට සිය අවංක කැපවීම සහ දායකත්වය පෙන්නුම් කළ අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රගතිය තකා නොසෙල්වී කටයුතු කළ සවිමත් වැඹක් බවට පත්විය. 2013 අප්‍රේල් මාසයේ දී ආයතනයේ කාර්යාලය පවත්වාගෙන යාම පිණිස අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ නව කොටසක් හිමි වූ අතර, ඒ සඳහා සපයන ලද දායකත්වය සම්බන්ධයෙන් ආයතනය විසින් අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමාට ස්තුතිය ප්‍රකාශ කර සිටිනු ලැබේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්යාලය වශයෙන් භාවිතා කිරීමට අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ කොටසක් සැපයීම සම්බන්ධයෙන් එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය වශයෙන් කටයුතු කළ කමලිනි ද සිල්වා මහත්මියට ආයතනය සිය ස්තුතිය පළ කර සිටිනු ලැබේ. අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සේවක සංඛ්‍යාව සේවකයන් 09 සිට 23 දක්වා වැඩි කරන ලද අතර, විනිශ්චයකාරවරයන් සමඟ ස්වකීය දැනුම සහ අත්දැකීම් බෙදා හදා ගැනීම පිණිස විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණතාවක් ලබා ඇති විශිෂ්ඨයන් සහ වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලබා ඇති නීති ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන්, විද්වතුන් සහ විශේෂඥවරුන් වෙත ආරාධනා කරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ දී විනිශ්චයකාරවරුන් ඇමතීම පිණිස විදේශීය විනිශ්චයකාරවරුන්ට සහ නීති ක්ෂේත්‍රයේ විශේෂඥයින්ට නිතිපතා ආරාධනා කිරීමට අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මහතා අමතක නොකළ අතර, ඒ මගින් ඔවුන්ගේ දැනුම සහ පළපුරුද්ද බෙදා හදා ගැනීමට අවකාශ විවර කළේය. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මෙන් ම විවිධ ස්ථානවල පවත්වන ලද බොහෝ සම්මන්ත්‍රණ, දේශන සහ විවිධ වැඩසටහන් සඳහා අග්‍රවිනිශ්චයකාරවරු ගරු මොහාන් පීරිස් මැතිතුමා පෞද්ගලිකව ම සහභාගී වූ අතර, ඔහුගේ දැනුම සහ පළපුරුද්ද විනිශ්චයකාරවරයන් සමඟ බෙදා හදා ගැනීම කළේය.

මෙම කාලය තුළ සාක්ෂි නීතිය සහ සිවිල් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ විනිශ්චයාසන පොත යාවත්කාලීන කිරීම පිණිස කමිටු දෙකක් පත් කරන ලදී. දැනට ගරු මොහාන් පීරිස් මැතිතුමා විසින් කීර්තිමත් සහ කෘතහස්ත විදේශීය විනිශ්චයකාරවරුන්ගේ සහාය ඇතිව නඩු කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍රය තුළ සිවිල් අධිකරණ පද්ධතිය සම්බන්ධයෙන් නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි නිරතව සිටියි. සිවිල් අධිකරණ පද්ධතිය සඳහා අවශ්‍ය නීති ප්‍රතිස්සංකරණ ගෙන ඒම සම්බන්ධයෙන් අග්‍ර විනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මහතා දක්වන පරිශ්‍රමයට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සිය ප්‍රශංසාව පළ කර සිටිනු ලැබේ.

අග්‍ර විනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා සිය ධුරයෙහි වැඩ භාර ගැනීමෙන් පසුව විශේෂයෙන් ම නඩු කළමනාකරණය, අධිකරණ කළමනාකරණය, අධිකරණ ආචාර ධර්ම පිළිබඳව විනිශ්චයකාරවරුන් දෙසීයකට අධික පිරිසකට මලයාසියාව, ඉන්දියාව, සිංගප්පූරුව වැනි රටවල විදේශ පුහුණුව ලබා දී ඇත. මෙම කාලය තුළ දී ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරකවරයාගේ තත්වයෙන් ලක්මාල් වික්‍රමසූරිය මහතාගේ සේවය ලබා ගන්නා ලද අතර, එතුමා විනිශ්චයකාරවරුන් සඳහා විදේශීය පුහුණු අවස්ථා සොයා ගැනීම පිණිස කැපවී කටයුතු කරන ලද අතර, ඒ අනුව ආයතනය විසින් දියත් කරන ලද විදේශීය පුහුණු වැඩ සටහන් සියල්ලක්ම සංවිධානය කරන ලදී. එබැවින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වෙනුවෙන් සියලු ම විදේශීය පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීමේ දී සහ සම්බන්ධීකරණය කිරීමේ දී ඒ මහතා විසින් දක්වන ලද කැපවීමට සහ සේවාවට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය ඒ මහතාට ස්තූතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගනු ලැබේ. අග්‍ර විනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මහතා සිය ධුරය හෙබ වූ කාලය තුළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වේගවත් ප්‍රගතියක් ලැබූ බව සාඩම්බරයෙන් සිහිපත් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ප්‍රගතිය පිණිස සම්පත් දායකයන් වශයෙන් මෙන් ම ආයතනයේ අනෙකුත් වැඩ කටයුතුවලට නිරන්තරයෙන් ම දැක්වූ සහයෝගයට උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ට සහ මහාධිකරණ විනිශ්චයාධිකාරවරයන්ට, අධ්‍යයන ප්‍රජාවට මෙන් ම විවිධ වෘත්තිකයින්ට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සිය අවංක කෘතඥතාවය පළ කර සිටිනු ලැබේ. එමෙන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ පුහුණු වැඩසටහන්වලට සහයෝගය ලබා දීමේ දී, ප්‍රධාන පෙළේ භූමිකාවක නිරත වෙමින් ඉමහත් සෙතක් සලසන ලද අධිකරණ සේවා කොමිෂන් සභාවේ හිටපු ලේකම් සිසිර රත්නායක මහතා මෙහි දී විශේෂයෙන් ම කෘතඥපූර්වකව සඳහන් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වර්තමානයේ දී අධිකරණ පුහුණුව සඳහා වන අන්තර්ජාතික ආයතනයේ (IOJT) සාමාජිකයකු වශයෙන් කටයුතු කරයි. අධිකරණ නිලධාරීන් සඳහා නීති සහ අධිකරණ තොරතුරු ප්‍රචලිත කිරීම අරබයා වෙබ් අඩවියක් සහ ඊ-පුස්තකාලයක් අද වන විට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සතුව පවතී. එමෙන් ම යාපනය, තංගල්ල මහාධිකරණ මෙන් ම අග්‍රවිනිශ්චයකාරයාගේ නිළ මැදිරිය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයට සම්බන්ධ කරන වීඩියෝ සම්මේලන පහසුකම් (video conferencing facility) ද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සතුව පවතී. එමෙන් ම පළමු අන්තර්ජාතික දත්ත සංහිතාව වන "මනුපත්‍ර" (Manupatra) නමැති ඉන්දියාවේ වෙබ් අඩවිය ද ආයතනය විසින් මිළ දී ගෙන තිබෙන අතර, මෙම වෙබ් අඩවිය නිසා ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය, මහාධිකරණය, ඇමෙරිකා එක්සත් ජනපදයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද නඩු තීන්දු මෙන් ම සාමි මන්ත්‍රී මණ්ඩලයේ නඩු තීන්දුවලට ප්‍රවේශ වීමට ද, අවස්ථාව උදා කරගෙන ඇත. ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධරයන් පුහුණු කිරීමේ දී සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයට ඉලෙක්ට්‍රොනික පුහුණු මෙවලම් ඇතුළුව පුහුණු අත්පොත් ලබාදීම සම්බන්ධයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් අධිකරණ මධ්‍යස්ථානය, මලයාසියාවේ විනිශ්චයකාරවරුන්ගේ ආයතනය, සිංගප්පූරුවේ විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සහ ඉන්දියාවේ අධිකරණ විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ලබාදුන් සහයෝගය ආයතනය විසින් වාර්තා කරගෙන ඇත.

2015 ජනවාරි මාසයේ දී ගරු විනිසුරු කේ. ශ්‍රී පවන් මැතිතුමා අගවිනිසුරු වශයෙන් පත්කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් එතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කලමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා බවට පත් විය.

අඛණ්ඩ අධිකරණ පුහුණුවීම් හරහා විනිශ්චයකාරවරයන්ගේ වෘත්තීය ප්‍රමිතිය ඉහල නැංවීම කෙරෙහි අගවිනිසුරු කේ.ශ්‍රී පවන් මැතිතුමා අවධානය යොමු කළ අතර, විනිශ්චයකාරවරයන් සඳහා සිවිල් නීති අංශයේ පුහුණුවීම් පැවැත්වීම පිණිස ගරු විනිසුරු ටී.බී.වීරසූරිය මැතිතුමා උපදේශකවරයෙකු වශයෙන් පත් කරන ලදී. මීට අමතරව, මහාධිකරණ විනිශ්චයකාරවරයන්, අධිකරණ නිලධාරීන් සහ කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන් සඳහා අත්‍යාවශ්‍ය වන පුහුණු වීම් ලබා දීම පිණිස ගරු විනිසුරු පී.එච්.කේ.කුලතිලක මැතිතුමා, ගරු විනිසුරු සලීම් මාර්සූෆ් මැතිතුමා, ගරු විනිසුරු පී.ඒ. රත්නායක

මැතිතුමා, ගරු විනිසුරු සුරේෂ් චන්ද්‍ර මැතිතුමා සහ ගරු විනිසුරු ඒ.ඩබ්ලිව්.ඒ සලාම් මැතිතුමා වැනි විශ්‍රාමික විනිසුරුතුමන්ලා වෙත ආරාධනා කිරීමට නොපැකිලිව කටයුතු කළේය.

විශ්ව විද්‍යාල විද්වතුන්, වෛද්‍ය වෘත්තිකයන්, තාක්ෂණික විශේෂඥයන්, ව්‍යවහාරික විද්‍යාඥයන්, බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ විශේෂඥයන්, වෙළඳ සහ මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයන් වැනි අනේකවිධ ක්ෂේත්‍රවල නියැලී සිටින දේශීය මෙන් ම විදේශීය සම්පත් දායකයන්ගේ දැනුම සහ පළපුරුද්ද විනිශ්චයකාරවරයන් සමඟ හුවමාරු කරගැනීම පිණිස මෙම කාලසීමාව තුළ දී ගරු අගවිනිසුරු ශ්‍රී පවන් මැතිතුමාගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් එකී විද්වතුන් වෙත ආරාධනා කරන ලදී. මෙහි දී NATA පනත ක්‍රියාත්මක කිරීම ප්‍රකාරව එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහයෝගීතාව ඇතිව චෙක්පත්‍ර සහ ගණුදෙනු පද්ධති යටතේ ගැනෙන බැංකු පරිචයන්, පරිගණක අපරාධ සහ විද්‍යුත් තාක්ෂණය යනා දී විෂයන් ආවරණය විය. මීට අමතරව කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන් ඉලක්ක කරගෙන තනාපතී වරප්‍රසාද පනත සහ රාජ්‍ය මුක්තිය පිළිබඳ සම්බන්ධයෙන් එක් වැඩමුළුවක් පවත්වන ලදී. ගරු අගවිනිසුරු කේ. ශ්‍රී පවන් මැතිතුමා මෙවැනි වැඩමුළු ගණනාවකට පෞද්ගලිකව ම සහභාගී වෙමින් එහි දී ප්‍රධාන දේශනය ඉදිරිපත් කරන ලදී.

විනිශ්චයකාරවරයන්ගේ අත්පොත යාවත්කාලින කිරීම පිණිස අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් ගරු විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතුව එක් කමිටුවක් ද, සාක්ෂි පිළිබඳව විනිශ්චයාසන පොත යාවත්කාලීන කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයාසනය හොබවමින් සිටි ගරු විනිශ්චයකාරවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතුව එක් කමිටුවක් ද, ගරු අග විනිසුරු කේ. ශ්‍රී පවන් මැතිතුමාගේ සභාපතිත්වය යටතේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලදී. මෙ කාලසීමාව තුළ දී ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා ලේකම්වරයෙකු, පුස්තකාලයාධිපතිවරයෙකු, දෘඩාංග සහ මෘදුකාංග තාක්ෂණික නිලධාරීවරයන්, කළමනාකරණ සහකාරවරුන් කිහිප දෙනෙකු, ගෘහ පාලකවරයෙකු සහ රියදුරෙකු ද බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

එමෙන් ම, අධිකරණ පරිපාලනය සහ ගිණුම්කරණ කාර්ය පටිපාටි පිළිබඳව අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ට පුහුණුවක් ලබාදීමට ද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් කටයුතු කරන ලදී. මෙම කාලය තුළ දී ම අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් 143 දෙනෙකු සඳහා "අධිකරණ පරිපාලනය, ආයතන සංග්‍රහය සහ අධිකරණ ගිණුම්කරණ පරිචයන්" පිළිබඳව වැඩමුළු 3ක් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පවත්වන ලදී. තව ද, මෙම කාලයේ දී මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පිළිබඳව කාති විනිසුරුවරුන් 53 දෙනෙකු සඳහා ද වැඩමුළුවක් පවත්වන ලදී.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් 2014 වර්ෂයේ දී මිලටගත් දී මනුපත්‍ර නෛතික දත්ත සංහිතාවට (Manupatra Legal Database) අමතරව, මෙම කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් එකී ආයතනයේ පුස්තකාලය වෙත වෙස්ට්ලෝ නෛතික දත්ත සංහිතාව (Westlaw Legal Database) මිලට ගන්නා ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ සියළුම විනිශ්චයකාරතුමන්ලා සහ කොළඹ මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලා වෙත තනි පුද්ගල රහස්‍ය පද සපයන ලදී. කොළඹින් බැහැර අධිකරණවල විනිසුරුවරුන් විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය හරහා සිදුකරන ලද ඉල්ලීමකට පසුව, මෙ පහසුකම සති දෙකක කාලසීමාවක් ඇතුළත එක් අවස්ථාවක දී කොළඹින් බැහැර සියළුම අධිකරණවල විනිසුරුවරුන් වෙත ව්‍යාප්ත කරන ලදී.

එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන සහ ලංකා බෙල් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සහයෝගීතාව ඇතිව, විනිශ්චයකාරවරයන්ගේ සුහසිද්ධිය පිණිස පර්යේෂණ සහ බහු සම්බන්ධතා පහසුකමක් සහිතව විනිසුරු නීති දත්ත සංහිතාවක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදී. මෙම නීති දත්ත සංහිතාව සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහනේ කොන්ත්‍රාත්කරුවකු අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙම

ව්‍යාපෘතිය වනාහි 2016 අයවැය යෝජනා යටතේ අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන විසින් ක්‍රියාත්මක කරන ඒකාබද්ධ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන විසින් උපදේශකවරයෙකු වශයෙන් අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් ගරු විනිසුරුවරයෙකු, නීතිඥවරුන් සහ නීති සිසුන් දැනටමත් බඳවාගෙන ඇත. ශ්‍රී ලංකා නීති වාර්තාවල, නව නීති වාර්තාවල, නීතිඥ සංගමයේ නීති වාර්තාවල සහ ශ්‍රීස්කාන්ත නීති වාර්තාවල වාර්තා කර ඇති නඩු තීන්දු පරිශීලනය කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් අධිකරණ අමාත්‍යාංශයේ, නීතිඥ සංගමයේ සහ ශ්‍රී ස්කාන්ත නීති වාර්තාවල සංස්කාරකවරයාගේ අවසරය ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් විනිශ්චයකාරවරයන් 151 දෙනෙකු සහ කම්කරු විනිශ්චයාධිකාරිවල සභාපතිවරුන් 30 දෙනෙකු විදේශ පුහුණු වීම් සඳහා විදේශ රටවලට යැවීම මෙම කාලය තුළ දී ලබාගත් එක් සුවිශේෂී ජයග්‍රහණයක් වේ. මෙම විදේශ පුහුණු වීම් නවදිල්ලි අධිකරණ ඇකඩමිය, ඉන්දියාවේ බෝපාල් නුවර පිහිටි ජාතික අධිකරණ ඇකඩමිය සහ මලයාසියාවේ අධිකරණ සහ නීති පුහුණු ආයතනය විසින් පවත්වන ලදී

මෙම කාලය තුළ දී, ගරු අගවිනිසුරු ශ්‍රී පවන් මැතිතුමාගේ සභාපතිත්වය යටතේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ලබාගත් අනෙක් සුවිශේෂී ජයග්‍රහණය වන්නේ උපරිමාධිකරණවල සේවයේ නියුතු සියළු ම විනිශ්චයකාරවරයන් සඳහා මෙන් ම ස්ථිර සේවයේ නියුතු අනෙකුත් සියළු ම විනිශ්චයකාරවරයන් සඳහා සහ කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන් සඳහා ද ලැප්ටොප් පරිගණක 294 ක් බෙදා දීමයි. ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ලබාගැනීමට ඉඩප්‍රස්ථාව සලසා තිබෙන අරමුදල්වලින් අධිකරණ අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් මෙම පරිගණක මිලදී ගෙන ඇත.

2017 වසරේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය "SLJI NET" - “ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මාර්ගගත නීති තොරතුරු ජාලය” දියත් කරන ලදී. එය නීතිමය තොරතුරු පිළිබඳ පළමු විනිසුරුවරුන්ගේ මාර්ගගත දත්ත සංහිතාව වේ. "SLJI NET" මඟින් වැදගත් නඩු නීති සහ නීතිමය තොරතුරු විෂය අනුව ශ්‍රී ලංකාවේ විනිසුරුවරුන්ට පමණක් ප්‍රවේශය සපයයි. "SLJI NET" ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ ශ්‍රී ලංකා මහාධිකරණවල වාර්තා කර ඇති සහ වාර්තා නොකළ නඩු තීන්දු, පනත්, විදේශ නඩු තීන්දු, වාර්තා සහ පුවත් ලිපි වෙත විෂයානුබද්ධ ප්‍රවේශය සඳහා විනිසුරුවරුන්ට පරිශීලක-හිතකාමී දත්ත ගබඩාවක් සඳහා ආධාරක මෙවලමක් වීමට අදහස් කරයි. එය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර වැඩසටහනේ සහාය ඇතිව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පර්යේෂණ අංශය මඟින් ශ්‍රී ලංකාවේ විනිසුරුවරුන්ට විෂයානුබද්ධ නීතිමය දත්ත සංහිතාවකට පිවිසීම පිණිස සඳහා නිර්මාණය කර ඇත.

ගරු එම්.ආර්.සී. ප්‍රනාන්දු මැතිතුමාගේ ඉල්ලා අස්වීමෙන් පසුව, 2017 වර්ෂයේ දී, ගරු විනිශ්චයකාර ඊ.ඒ.ජී.ආර්. අමරසේකර මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සභාපති වශයෙන් පත්කරන ලදී.

2018 මුල් භාගයේ දී, ගරු විනිසුරු ජානක ද සිල්වා මහතා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ගරු විනිසුරු ඊ.ඒ.ජී.ආර් අමරසේකර මහතා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් පසුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකාරණ මණ්ඩලය විසින් ගරු විනිසුරු ජානක ද සිල්වා මහතා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ඉන්පසුව, මහාධිකරණ විනිසුරු ගරු එම්.පී.ඩී සිල්වා මහතා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරයට පත්කරන ලදී. එම වසරේ දී ම, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරක ලෙස අතිරේක මහේස්ත්‍රාත් ඩී.එම්.ඒ සෙනෙවිරත්න මහතා පත් කරන ලදී.

2019 වර්ෂයේ දී, ගරු විනිසුරු ජානක ද සිල්වා මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් පසුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකාරණ මණ්ඩලය විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ ධුරයට පත්කරන ලදී.

2020 වර්ෂයේ දී, කළමණාකරන මණ්ඩලය විසින් ගරු මහාධිකරණ විනිසුරු ඩී.එෆ්.එච්. ගුණවර්ධන මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයට පත්කරන ලදී. අභිනවයෙන් බඳවාගන්නා ලද විනිසුරුවරුන් සඳහා 2020 වර්ෂයේ දී, පුහුණු සැසිවාර බොහෝමයක්ම ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වත ලද අතර, ඊට හේතුව වූයේ කොවිඩ් - 19 වසංගතයේ බලපෑමයි. .

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රගතිය වෙනුවෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සහ එහි කාර්ය මණ්ඩලයට, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමාට, එක්සත් ජාතීන්ගේ එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන (USAID CORE Justice), යුරෝපා කවුන්සිලයට, වානිජ නීති සංවර්ධන වැඩසටහනට *(CLDP)*, එක්සත් ජනපදයේ පේටන්ට් සහ වෙළඳ ලකුණු කාර්යාලයට *(USPTO)*, එක්සත් ජාතීන්ගේ ආහාර වැඩසටහනට (FAO), ජාත්‍යන්තර සාමය සහ නීතියේ පාලනය සඳහා වන මැක්ස් ප්ලෑන්ක් පදනමට, ඇමෙරිකානු නීතිඥ සංගමයට, නීතියේ පාලනය පිළිබඳ මූලාරම්භක වැඩසටහනට සහ අනෙකුත් අරමුදල් සපයන ආයතනවලට මෙන්ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය මණ්ඩලයට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සිය ස්තුතිය පුදකර සිටියි.

(History from 1985-1991 (Courtesy Judges' Journal Vol. 1)

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වනාහී අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර, එහි පරිපාලනය සහ කළමනාකරණය කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී තිබේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය, අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් සහ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර, අග්‍රවිනිශ්චයකාරවරයා මණ්ඩලයේ සභාපතිවරයා වේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රතිව්‍යුහගත සැලැස්මෙන් පසුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ආයතනික ව්‍යුහය පහත දැක්වේ.

### ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය

2019 වර්ෂයේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ.

ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාරවරයා වන ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය මැතිතුමා (සභාපති) සහ ජනධිපති නීතිඥ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, ගරු බුවෙනක අලුවිහාරේ මැතිතුමා (සාමාජික) සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, ගරු සිසිර ජේ.ද ආබෲ මැතිතුමා (සාමාජික) වේ.

### ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම පිණිස ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා, නිලධාරීන් සහ සේවකයන් පත්කරන අතර, අධ්‍යක්ෂවරයා, නිලධාරීන් සහ සේවකයන් සම්බන්ධයෙන් විනය පාලනය (සේවයෙන් පහ කිරීමේ බලතල ඇතුළුව) ක්‍රියාත්මක කිරීම ද ඉටු කරනු ලැබේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ, නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ වැටුප් සහ වේතන සහ සේවා කොන්දේසි තීරණය කිරීමේ බලය ද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී ඇත.

| | | |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂවරයා | ගරු විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය මැතිතුමා |
| | | |
| 2 | නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා | ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා |
| | | |
| 3. | උපදේශක | ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය |
| | | |
| 4. | අධ්‍යයන සම්බන්ධීකාරක | ඩී. එම්. ඒ සෙනෙවිරත්න මහතා |
| | | |
| 5. | ලේකම් | එච්. එම්. කුමුදුණී මදුවන්ති මහත්මිය |
| | | |

| | | |
|---|---|---|
| 6. | ගණකාධිකාරී | යූ. වී. රත්මිණී රාජකරුණා මහත්මිය |
| | | |
| 7. | පර්යේෂණ නිලධාරි | ඩබ්ලිව්. එම්. එම්. කරුණාරත්න මිය |
| | | |
| 8. | ගිණුම් සහකාර **(අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් අනුයුක්ත කරන ලද, අධිකරණ රෙජිස්ට්‍රාර්)** | දීපිකා ගුණසේකර මහත්මිය |
| | | |
| 9. | අධිකරණ සේවා කළමනාකරණ සහකාරවරුන් **(අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් අනුයුක්ත කරන ලද, )** | ජී. එම්. උදේනි දිල්රුක්ෂි අපොන්සු මහත්මිය<br>එස්. එම්. ඒ.රුවන් සාමසුන්දර මහතා |
| | | |
| 10. | දෘඩාංග සහ මෘදුකාංග තාක්ෂණ ශිල්පීන් | කේ. එල්. ඒ. කසුන් තාරක පද්මසිරි මහතා<br>ඒ. ටී. ගයාන් ගුනතිලක මහතා |
| | | |
| 11. | පොත් බඳින්නන් **(අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් අනුයුක්ත කරන ලද,)** | ඩබ්ලිව්. ජී. ඒ. ඩී. වීරසිංහ මහතා |
| | | |
| 12. | කාර්යාල කාර්ය සහායක (අධිකරණ අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරන ලද,) | එන්. වීරසිංහ මහතා<br>එච්. පී. පී. ඩී. පෙරේරා මහත්මිය |
| | | |
| 13. | කාර්යාල කාර්ය සහායක | මේනකා පද්මසීලි මහත්මිය<br>නදීෂා චතුරංගනී මහත්මිය<br>සානිකා ලක්ෂානි රතුගමගේ මහත්මිය |
| | | |
| 14 | රියදුරු | ජී. ඩමලිව්. රංජිත් මහතා |
| | | |
| 15 | ගෘහ පාලක | එච්. කේ. ටී. එම්. සෙනෙවිරත්න මහතා |
| | | |

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අරමුදල්

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ම හිමි, ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පරිපාලනය කරන අරමුදල් තිබේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශය හරහා ගලනය වන මහා භාණ්ඩාගාර ප්‍රදානවලින් ප්‍රදාන වශයෙන් ම ආයතනයේ මූල්‍ය කටයුතුවලට අවශ්‍ය මුදල් සම්පාදනය කරගනු ලැබේ. මෙම වියදම් සඳහා අධිකරණ අමාත්‍යාංශය / මහා භාණ්ඩාගාරය උපරිම වියදම් සීමා පනවන අතර, මෙම සීමාවන් ඇතුළත ක්‍රියාත්මක වීමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට සිදුවී ඇත.

1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතෙහි විධිවිධාන ප්‍රකාරව, ජනාධිපතිවරයා විසින් අනුමාන කරන යම් කවර ම මූලාශ්‍රවලින් ලැබෙන පරිත්‍යාග, තෑගි සහ ප්‍රදාන භාර ගැනීමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට බලය තිබෙන අතර, එවැනි යම් කවර ම වූ මූලාශ්‍රවලින් ආයතනයට ලැබෙන පරිත්‍යාග, තෑගි සහ දීමනා ආයතනයේ අරමුදලට ගෙවිය යුතු වේ. ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් දරන සියලු ම වියදම් (පඩිනඩි ගෙවීම ද ඇතුළුව) ආයතනයේ අරමුදලින් ගෙවා පියවා දැමිය යුතුය.

මහා භාණ්ඩාගාරය විසින් අධිකරණ අමාත්‍යාංශය හරහා 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙත ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් මිලියන 1.75 ක් ද, පුනරාවර්තන වියදම් වශයෙන් රුපියල් මිලියන 13.6 ක් ද, ප්‍රදානය කර ඇත.

## පුහුණු වැඩසටහන්

1985 වර්ෂයේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ආරම්භ කළ අවස්ථාවේ පටන් ආයතනය තුළ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් ගණනාවක් ම පවත්වා ඇත. කෙසේ වුව ද, 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වඩ වඩාත් පුළුල් කිරීමත් සමඟ ම, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් දියත් කරන ලද වැඩසටහන් මඟින් මහාධිකරණ විනිශ්චයකාරවරයන්, දිසා විනිශ්චයකාරවරයන්, මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන්, කාති උසාවිවල විනිශ්චයකාරවරයන් සහ අධිකරණ කළමනාකරණ සහකාරවරුන් සඳහා ද සේවයක් ඉටු කිරීමට අපේක්ෂා කරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මෙහි ඉහත සඳහන් කරන ලද පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අධිකරණය පිළිබඳ අධ්‍යාපනය, කුසලතා සංවර්ධනය ඇතුළුව ශක්‍යතාව සවිබල ගැන්වීම, ආකල්පමය වෙනසක් ඇති කිරීම සහ සමාජමය කැපවීම අරමුණු කරගෙන සකස් කරන ලද වැඩසටහන් හරහා අධිකරණ කාර්ය සාධනයේ ඉහළ ප්‍රමිතියක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය කැප වී ක්‍රියා කරයි. තව ද, අධ්‍යාපනය සහ පර්යේෂණ හරහා වැඩි දියුණු කළ අධිකරණ පරිපාලනය සහ කළමනාකරණය තවදුරටත් සංවර්ධනය කොට ස්ථාපිත කිරීම පිණිස ද, විනිශ්චයකාරවරයන්ගේ ආයතනය කැපවීමෙන් යුක්තව සිය සේවය ඉටු කරමින් සිටියි. අධිකරණ සේවාවේ විෂය පථය තුළ සිටින මුල් අධිකරණ බලය හිමි අධිකරණවල විනිශ්චයකාරවරයන් සහ කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කටයුතු කිරීමට විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් දියත් කරන පුහුණු වැඩසටහන්වලින් නිබඳව ම අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පුහුණු වැඩසටහන්වලට සහභාගී වන සියලුම විනිශ්චයකාරවරයන්ට අදාළ වන පොදු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වුව ද, පුහුණු අත්පොත් සහ

පුහුණුවට සහභාගී වන්නන්ගේ ස්වභාවය මත පුහුණු අවශ්‍යතාවන් වෙනස් වේ. පුහුණුවේ ස්වභාවය හා අධිකරණ නිලධරයාගේ පළපුරුද්ද හෝ ඔහු විසින් පුහුණු සැසිවාරවල මුල් අවස්ථාවේ දී අත්කරගෙන ඇති දැනුම මත පුහුණු වැඩසටහනක් විධානාත්මක, ස්වේච්ඡා හෝ වෛකල්පික විය හැකිය. අදාළ පුහුණු වැඩසටහන පාලනය කිරීමේ බලය ඇති තැනැත්තා කවරෙක් ද යන වග සහ පුහුණු වැඩසටහන්වලට අරමුදල් සම්පාදනය කරන්නේ කෙසේ ද යන කාරණය සහ පුහුණුවේ ඉලක්කගත කණ්ඩායම් සහ පුහුණුවට ගතවන කාලය යන ගැටළු, පුහුණු වැඩසටහනින් ම ආවරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ අධිකරණ නිලධරයන්ගේ සමස්ත වෘත්තීය ජීවිතය පුරාම ඔවුන්ගේ වෘත්තීමය විශේෂඥතාව ඉහල නැංවීම සහ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම ඉලක්ක කරගෙන අනිවාර්ය සේවාස්ථ පුහුණු වැඩසටහනට සහභාගී වන ලෙස නියම කරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ආයතනය තුළ එක් එක් සෙනසුරාදා දිනවල දී, පවත්වන සේවාස්ථ පුහුණු වැඩසටහන්වලට සහභාගී වන ලෙස මෙම අධිකරණ නිලධරයන්ට නියම කරන අතර, සහභාගී වීමට නොහැකි වූ අවස්ථාවක දී එවැනි අනිවාර්ය සේවාස්ථ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට නොහැකි වීමට බලපෑ හේතුව නිසි බලධරයන් වෙත දැනුම් දීමට නියම කරනු ලැබේ.

අලුතෙන් ම පත්වීම් ලැබ පුහුණුව ලබන අධිකරණ නිලධරයන් ඉලක්ක කරගෙන දෛනික පදනමක් මත හැඳින්වීමේ සහ මූලික පුහුණු වැඩසටහන් පවත්වනු ලබන අතර, එම පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම අනිවාර්ය වේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පවත්වන එවැනි පුහුණු සැසිවාරවලට සහභාගී නොවී සිටීමට එම අධිකරණ නිලධරයන්ට නොහැකි වේ. තව ද, සේවයේ නියුක්ත අධිකරණ නිලධරයකු වැඩිදුරටත් පුහුණු වීම සඳහා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට අනුයුක්ත කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගෙන ඇති අවස්ථාවක දී, අනෙක් පුහුණු අවශ්‍යතාව පැන නගිනු ලැබේ.

## පුහුණුවේ ස්වභාවය

### 1. අනිවාර්ය පුහුණුව

ඉහත සඳහන් කළ පරිදි සේවයේ නියුක්ත සහ පුහුණුවන අධිකරණ නිලධාරීන් සඳහා වන පවත්නා අඛණ්ඩ අනිවාර්ය අධිකරණ පුහුණුව නොකඩවාම සිදු කර ගෙන යන අතර, වෛකල්පික හා ස්වේච්ඡා පුහුණු වැඩසටහන් හුදෙක් සේවයේ නියුක්ත අධිකරණ නිලධරයන් සඳහා ඉහළ නංවනු ලබයි. කෙසේ වුව ද, අධිකරණ නිලධරයන්ගේ අවශ්‍යතාවන් සැලකිල්ලට භාජනය කරමින් සහ තාක්ෂණය පදනම් කරගත් මුහුණට - මුහුණ ලා කෙරෙන දූරස්ථ අධ්‍යයන තාක්ෂණය පදනම් කරගත් ස්වයං - හැදෑරීමේ අධිකරණ පුහුණුව ප්‍රචලිත වන වර්තමාන සන්දර්භය තුළ වෙනත් අධිකරණ බලසීමාවන් තුළ සිදුවන වෙනස්කම් සැලකිල්ලට භාජනය කරමින් අධිකරණ පුහුණුව සඳහා නව ප්‍රවේශයන් හඳුන්වා දෙනු ලැබේ.

### 2. වෛකල්පික පුහුණුව

අධිකරණ නිලධරයන්ගේ ප්‍රමිතිය සහ අවශ්‍යතාව මත, අධිකරණ කටයුතු වලදී ඉංග්‍රීසි බස ලිඛිතව හැසිරවීම, පෞරුෂතා සංවර්ධනය, පරිගණක පුහුණුව, සෞඛ්‍ය ප්‍රර්ධනය වැනි වෙනත් අධිකරණ බලසීමා සම්බන්ධ ආධාරක පාඨමාලා වෛකල්පික පාඨමාලාවන් වශයෙන් සලකනු ලැබේ. එමෙන් ම සේවස්ථ අධිකරණ නිලධරයන් සඳහා උපදේශන වැඩසටහන් වැනි ආධාරක පාඨමාලා වෛකල්පික වැඩසටහන් වේ.

### 3. පුහුණු වන කාලසීමාව

මනා ලෙස ස්ථාපිත ස්වයං සංවර්ධන හෝ පුහුණු වීම් වැඩසටහන්වලින් සංගෘහිත ශාස්ත්‍රීය අධ්‍යයන ආයතනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් විනිසුරුවරුන් බිහිවන රටවල් මෙන් නොව, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්විට, පෞද්ගලික ක්ෂේත්‍රයේ නීතිඥ වෘත්තියේ හෝ රජයේ නීතිඥ වෘත්තියේ නීතිඥවරයකු වශයෙන් ආරම්භක අනිවාර්ය සේවා කාලයක් සපුරා ඇති නීතිඥවරුන්ගෙන් අධිකරණ නිලධරයන් පත්කරනු ලැබේ. ශ්‍රී ලාංකික අත්දැකීම්වලින් පිළිඹිබු වන්නේ ඇගයීම් ක්‍රමවේදයකට පසුව ආරම්භක පුහුණු කාලය දීර්ඝ කරන සිවිල් නීති අධිකරණ බලසීමාවන් සමඟ සැසඳීමේ දී, අධිකරණ පුහුණුව සාමාන්‍යයෙන් මාස හයකට පමණ සීමා වන බවයි. මෙම අධ්‍යයන මොඩියුලයෙන් යෝජනා කෙරෙන්නේ අනිවාර්ය ඉදිරිපත් කිරීම්, පර්යේෂණ වැඩ සහ නිබන්ධනයක් ඉදිරිපත් කිරීමත් සමඟම අදාළ පුහුණුව එක් වසරක කාලයක් සඳහා දීර්ඝ කළ යුතු බවයි.

### 4. පුහුණු බලධාරීන්

වර්තමානයේ දී, අධිකරණ නිලධරයන් සඳහා පුහුණුවීම් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ඉටු කරනු ලබයි. එසේ වුව ද, අධිකරණ නිලධාරීන් සඳහා අදාළ වන සහ ප්‍රයෝජනවත් වන යම් සුවිශේෂී වැඩසටහන් පැවැත්වීම පිණිස ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් ඊට අදාළ රජයේ නියෝජිතායතනවලට සහ විශ්ව විද්‍යාල ආයතනවලට අවසරය ප්‍රදානය කරනු ලැබේ. අධිකරණ නිලධරයන් සඳහා විදේශ පුහුණු වැඩසටහන් දියත් කරන විටක දී, එවැනි පුහුණු සැසිවාර, විදේශීය විශ්ව විද්‍යාල, අධිකරණ අධ්‍යයන ආයතන හෝ ඒ පිළිබඳ විශේෂඥතාවක් ලබා ඇති ආයතනය විසින් පවත්වනු ලබයි.

### 5. අධිකරණ පුහුණුකරුවන්

වර්තමානයේ දී, අධිකරණ නිලධරයන් සඳහා අධිකරණ පුහුණුවීම් ලබා දෙන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ අධිකරණ විනිශ්චයකාරවරුන් විසිනි. එසේම, රජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරීන් විසින් ද, යම් තෝරාගත් පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. එමෙන් ම, දැනුම, පළපුරුද්ද සහ අධිකරණ නිලධාරීන් සම්බන්ධයෙන් ලබා ඇති විශේෂඥතාව වැනි සාධක සැලකිල්ලට භාජනය කරමින් අධිකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම පිණිස සුප්‍රකට නීතිවේදීන් සහ විද්වතුන්ට ද, ආරාධනා කරනු ලැබේ. පුහුණුව ලබන අධිකරණ නිලධරයන්ගේ අධ්‍යාපන පාඨමාලා සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, එම පුහුණු පාඨමාලා හුදෙක් ම විශ්‍රාමික සහ දැනට සේවයේ නිරත අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සහ මහාධිකරණ විනිශ්චයකාරවරුන් මෙන් ම, නීතිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නීති නිලධරයන් විසින් ද පවත්වනු ලැබේ. තව ද, හඳුනාගැනීමේ පෙරෙට්ටු, මරණ පරීක්ෂණ සහ ස්ථානීය පරීක්ෂණ සහ එමෙන් ම ප්‍රකාශ සටහන් කිරීම වැනි ප්‍රායෝගික පුහුණුවීම් හා විවාදාත්මක අධිකරණ සැසිවාර පැවැත්වීම සඳහා ජ්‍යෙෂ්ඨ මහේස්ත්‍රාත්වරුන්ට ද ආරාධනා කරනු ලැබේ. එමෙන් ම, පරිගණක පාඨමාලා, ඉලෙක්ට්‍රොනික පාඨමාලා, මානසික සංවර්ධනය, ව්‍යවහාරික වෛද්‍ය විද්‍යා වැඩසටහන් වැනි කාර්යගත ආධාරක පාඨමාලා හුදෙක් ඒ පිළිබඳ විශේෂඥතාවක් ලබා ඇති බාහිර පුහුණුකරුවන් යෙදවීමෙන් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

## පුහුණු පාඨමාලාවල ඉලක්ක සහ පරමාර්ථ

1. යුක්තිය පසිඳලීමේ දී අධිකරණ නිලධරයාගේ ගරුත්වය සහ විනිශ්චයකාරවරයන්ගේ භූමිකාව අවබෝධ කරගැනීම;

2. අධිකරණ නිලධරයන්ගේ අධිකරණමය සහ පරිබාහිර අධිකරණමය කටයුතුවල දී මහජන විශ්වාසය ගිලිහී යාම අවම කර ගැනීම පිණිස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ දී අධිකරණ නිලධරයන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක වැදගත්කම අවබෝධ කරගැනීම;

3. නඩු කියන්නන්ගේ සහ මහජනතාවගේ සැක පළකිරීමෙන් ඔබ්බට ගොස් පෞද්ගලික කටයුතුවල පාලනය පිණිස මූලික නියමයන් අවබෝධ කරගැනීම;

4. අධිකරණවල සේවයේ නිරත නිලධාරීන්, නඩුකියන්නන් සහ මහජනතාව අතුළුව අධිකරණ චර්යාවේ සහ අධිකරණ ශිල්පයේ රීතීන් අවබෝධ කරගැනීම;

5. අධිකරණ නිලධරයන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය සංවර්ධනය කිරීම; (ලිඛිත ආචාර ධර්ම සංග්‍රහය හෝ ස්වයං-පැනවුම් චර්යා ධර්ම සංග්‍රහය)

## සේවාස්ථ පුහුණු පාඨමාලාවල අඩංගු කරුණු

1. අධිකරණ චර්යාව, ආචාර ධර්ම සහ ක්‍රියාකලාපය;
2. හරයාත්මක නීතිමය දැනුම (හරවත් සහ කාර්ය පටිපාටික නීතිය - අපරාධ , සිවිල්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, වානිජ නීතිය, අපරාධ සහ සිවිල් නඩු විධාන කාර්ය පටිපාටිය, සාක්ෂි නීතිය ආදිය)
3. විශේෂ නීති සහ පනත්;
4. පෞද්ගලික නීති;
5. මානව අයිතිවාසිකම්;
6. දූෂණ විරෝධී නීති;
7. පරිගණක සාක්ෂරතාව සහ තොරතුරු තාක්ෂණය;
8. බුද්ධිමය දේපළ;
9. අධිකරණ පරිපාලනය සහ අධිකරණ කළමනාකරණය;
10. නඩු කළමනාකරණය සහ නඩු ප්‍රවාහ කළමනාකරණය;
11. ගිණුම් සහ මුදල්;
12. විනය කාර්ය පටිපාටිය;
13. ළමා යුක්තිය;
14. යුක්තියට සහ නීති ආධාරවලට ප්‍රවේශය;
15. වෝහාරික විද්‍යාව සහ වෝහාරික වෛද්‍ය විද්‍යාව;
16. නඩු තීන්දු ලිවීම;

17. දඬුවම් පැනවීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මක කිරීම;
18. පර්යේෂණ ක්‍රමවේදය සහ පරිගණකය ඇසුරින් ඔන්ලයින් පර්යේෂණ සහ ක්‍රමවේදය;
19. විකල්ප ආරවුල් විසඳීම;
20. පෞරුෂත්වය සහ කුසලතා සංවර්ධනය;
21. සෞඛ්‍ය සංවර්ධනය සහ ආතති කළමනාකරණය;
22. ප්‍රායෝගික පුහුණුව, නඩු තීන්දු ලිවීමේ අභ්‍යාස, විසඳනාවන් කෙටුම්පත් කිරීම, චෝදනා සකස් කිරීම, හඳුනාගැනීමේ පෙරෙට්ටු, හදිසි මරණ පරීක්ෂණ පැවැත්වීම, පාපෝච්චාරණ සහ ප්‍රකාශ සටහන් කිරීම, ස්ථානීය පරීක්ෂණ සටහන් සකස් කිරීම;

## පුහුණු ක්‍රමවේද

1. කේන්ද්‍රීය සම්මුඛ සන්නිවේදන ක්‍රමවේදය;
2. විමධ්‍යගත / ප්‍රත්‍යන්ත පාදක සම්මුඛ සන්නිවේදන ක්‍රමවේදය;
3. අධිකරණ පාදක උපදේශක ක්‍රමවේදය;
4. පත් කළ උපදේශකවරුන් මඟින් කරන කේන්ද්‍රීය උපදේශක ක්‍රමවේදය (පත් කරන සම්පත් දායකයින්)
5. තනි තනි නිලධරයන් සඳහා රේඛිත ක්‍රමවේදය;
6. තොරතුරු තාක්ෂණය සහ වෙබ් අඩවි පාදක දුරස්ථ අධ්‍යාපන ක්‍රමය;
7. දෛනික වැඩ මෙවලම්, විනිශ්චයාසන පොත්, ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය පටිගත අධ්‍යාපන මෙවලම්;
8. මොඩියුලර්;
9. පාඨමාලා අත්පොත්;
10. පරිශීලන මෙවලම්;
11. පර්යේෂණ මෙවලම්;
12. වීඩියෝ සම්මේලන;
13. ප්‍රායෝගික ක්‍රමවේද, විවාදාත්මක සැසිවාර;
14. අධිකරණ නැරඹීම;
15. ඉදිරිපත් කිරීම;
16. රචනා ලිවීම;
17. පර්යේෂණ වැඩ;
18. තනි පුද්ගල පාඨමාලා මෙවලම් සකස් කිරීම;
19. විදේශීය පුහුණු ක්‍රමවේදය;
20. උපදේශකත්වය;

උපදේශක පුහුණු පාඨමාලාව දෙයාකාර වැඩසටහන්වලින් සමන්විත වන අතර, එනම්, අග්‍රවිනිශ්චයකාරවරයා විසින් පවත්වන අධිකරණ පාදක උපදේශක වැඩසටහන සහ සම්පත් දායකයන් විසින් මෙහෙයවන කේන්ද්‍රීය උපදේශක වැඩසටහන වශයෙනි. ශ්‍රී ලංකාවේ දී, උපදේශකත්වය යම් කවර ම නිල හඳුනා ගැනීමකින් තොරව පෞද්ගලික මට්ටමක දී පුහුණුවක් වශයෙන් භාවිතා කරනු ලැබේ. කෙසේ වුව ද, අලුත් පුහුණු අත්පොත් මඟින් උපදේශක පුහුණු වැඩසටහනක් හඳුන්වා දෙන අතර, ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරුන් වන කෘතහස්ත සම්පත් දායකයන් දෙදෙනෙකු විසින් අධිකරණ නිලධරයන්, මහාධිකරණ විනිසුරන් සහ කම්කරු විනිශ්චයාධිකාරවල සභාපතිවරුන් වෙත උපදෙස් දීම කරනු ලැබේ. උපදේශකවරුන් විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලැබේ.


1. අපරාධ නීතිය සහ සාක්ෂි - මුල් අවස්ථා අධිකරණ බලය සහිත සහ අභියාචනා - ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරු (උපදේශක)

2. සිවිල් නීතිය සහ කම්කරු නීතිය - මුල් අවස්ථා අධිකරණ බලය සහිත සහ අභියාචනා - ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරු (උපදේශක)

මෙවැනි ස්වභාවයේ පුහුණු වීම් ප්‍රධාන වශයෙන් ම පූර්ව සැලසුම්ගත දුරකථන ඇමතුම්, ඊමේල්, වෙබ් අඩවි පාදක ක්‍රමවේද මෙන් ම පූර්ව සැලසුම්ගත සම්මුඛ ආයතනික සැසිවාර හරහා පවත්වනු ලැබේ.

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය සාධනය

1. ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර, එය පහත දැක්වේ.



2. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සේවක සංඛ්‍යාව 71 වන මුල්‍ය රෙගුලාසිය ප්‍රකාරව සහ ඊට යටත්ව මෙහි පහත පරිදි අනුමත කර ඇත.

| තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| උපදේශක | 02 |
| අධ්‍යයන සම්බන්ධීකාරක | 01 |
| ලේකම් | 01 |
| ගණකාධිකාරි | 01 |
| පර්යේෂණ නිලධාරී | 02 |
| මෘදුකාංග/දෘඩාංග තාක්ෂණ ශිල්පී | 02 |
| පුස්තකාලයාධිපති | 01 |
| කළමනාකරණ සහකාර | 05 |
| රියදුරු | 03 |
| ගෘහ පාලක | 01 |
| කාර්යාල කාර්ය සහායක | 05 |

# 2020.01.01 වන දින සිට 2020.12.31 වන දින දක්වා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ක්‍රියාකාරකම්

## දේශීය වැඩමුළු

| අනු අංකය | වැඩමුළුවේ නාමය | සහභාගී වූ විනිශ්චයකාරවරයන්ගේ තනතුරු නාමය | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | සහභාගී වූ විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මිනිස් වෙළඳාම පිටුදැකීමේ නඩුකටයුතු පිළිබඳ ආදර්ශ නඩු විභාග | මහාධිකරණ විනිශ්චයකාරවරයන් | 1 | 35 |
| 02 | මුදල් විශුද්ධිකරණය පාදක කරගත් නේවාසික සම්මන්ත්‍රණය | අධිකරණ නිලධාරීන් | 1 | 83 |
| 03 | මානව අයිතිවාසිකම් නීතිය පිළිබඳ නේවාසික වැඩමුළුව | මහාධිකරණ විනිශ්චයකාරවරයන් /අධිකරණ නිලධාරීන් | 1 | 25 |

## විදේශ පුහුණු වැඩසටහන්

| අනු අංකය | වැඩමුළුවේ නාමය | සහභාගී වූ විනිශ්චයකාරවරයන්ගේ තනතුරු නාමය | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව | සහභාගී වූ විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | අපරාධ වැළැක්වීම සහ අපරාධ යුක්තිය පසිඳලීම (ජ්‍යෙෂ්ඨයන් සඳහා වන සම්මන්ත්‍රණය) - ජපානය | මහාධිකරණ විනිශ්චයකාරවරයන් | 01 | 01 |
| 02 | ශ්‍රී ලංකාව තුළ අපරාධ යුක්ති ක්‍රමය සවිබල ගැන්වීම - ජපානය | මහාධිකරණ විනිශ්චයකාරවරයන් | 01 | 03 |
| 03 | අතීත,වර්තමාන සහ අනාගත ගෝලීය අධිකරණමය ජාලයේ ඉහළ පෙළේ රැස්වීම | මහාධිකරණ විනිශ්චයකාරවරයන් | 01 | 01 |

## අලුතෙන් බඳවාගත් විනිසුරුවරුන් සඳහා වෘත්තියට හුරුවීමේ සමාරම්භක පුහුණු වැඩසටහන

2020.03.02 වන දින අභිනවයෙන් බඳවා ගන්නා ලද විනිශ්චයකාරවරුන් සඳහා පුහුණු වැඩසටහන් ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වන ලද අතර, ඊට හේතුව වූයේ කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය තාවකාලිකව වසා තැබීම නිසයි.

| අනු අංකය | දිනය | පුහුණු වැඩසටහන | සම්පත් දායකයාගේ නාමය | සාකච්ඡාවට භාජනය කරන ලද විෂය ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| | 2020/03/02 | සමාරම්භක සැසි වාරය | ගරු විනිසුරු එල්ටීබී.දෙහිදෙනිය මැතිතුමා<br><br>ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය | පෙ.ව.9.15 ට ආරම්භ විය. සමාරම්භක පිළිගැනීමේ කතාව ගරු විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය මැතිතුමා විසින් සිදුකරන ලදී.<br><br>තේ පැන් සංග්‍රහය සඳහා විවේකය.<br><br>ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිළිබඳ වීඩියෝ පටයක් දර්ශනය කිරීම.<br><br>ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා විසින් සැසිවාරය ඇමතීම.<br><br>ගරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සහ ගරු විනිසුරු අනුෂ්ක සෙනෙවිරත්න මැතිතුමා විසින් **වෘත්තියට හුරුවීමේ සමාරම්භ පුහුණු වැඩසටහන පිළිබඳ හඳුන්වාදීම.**<br><br>ප.ව. 12.30 ට පුහුණු වැඩසටහන නිමාවීම.<br><br>ප.ව. 12.30 -ප.ව. 1.30 - දිවා ආහාරය.<br><br>නැවත ප.ව.1.30 - ප.ව. 3.30 දක්වා<br><br>**අධිකරණ ශාලාවල්වල පොදු චාරිත්‍රවිධි සහ සම්ප්‍රදායන්** පිළිබඳ ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා විසින් සැසිවාරය ඇමතීම. |
| 01. | 2020/03/03 | 1. උසාවි නැරඹීම<br>2. දේශන | ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා | **පූර්ව නඩු විභාග කාර්යපටිපාටිය** |

| | | | | |
|---|---|---|---|---|
| | | සැසිවාරය | | |
| 02. | 2020/03/04 | විනිශ්චය කිරීම පිළිබඳ දේශනය<br><br>අධිකරණමය ක්‍රියාකලාපය සහ ආචාර ධර්ම පිළිබඳ දේශනය (ගුණ විනිශ්චයකාරවරයා නුගුණ විනිශ්චයකාරවරයා) | ගරු විනිසුරු වසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය | **විනිශ්චය කිරී පිළිබඳ දේශනය**<br>පෙ.ව. 8.30 සිට ප.ව. 9.45 දක්වා.<br>පවර්පොයින්ට් මාධ්‍යයේ පිටපත් සැසිවාරයට සහභාගී වූ විනිශ්චයකාරවරුන් සඳහා බෙදාදීම.<br><br>**අධිකරණමය ක්‍රියාකලාපය සහ ආචාරධර්ම**<br>පෙ.ව.10.00 සිට ප.ව. 12.30 දක්වා.<br>පවර්පොයින්ට් මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම භාවිතයට ගැනීම. CMJA විසින් සකස් කරන ලද සංවාදයක් භාවිතයෙන් සංසන්දනය සිදුකරන ලදී. |
| 03. | 2020/03/05 | 1.උසාවි නැරඹීම<br>2.දේශන සැසිවාර | ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා | **බෙදුම් නඩු නීතිය** |
| 04. | 2020/03/06 | 1.උසාවි නැරඹීම<br>2.දේශන සැසිවාර | ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා | **බෙදුම් නඩු නීතිය** |
| 05. | 2020/03/10 | 1.උසාවි නැරඹීම<br>2.දේශන සැසිවාර | ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා | **බෙදුම් නඩු නීතිය** |
| 06. | 2020/03/11 | 1.උසාවි නැරඹීම<br>2.දේශන සැසිවාර | ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා | **බෙදුම් නඩු නීතිය** |
| 07. | 2020/03/12 | 1.උසාවි නැරඹීම<br>2.දේශන සැසිවාර | ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා | **බෙදුම් නඩු නීතිය** |
| **ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වන ලද දේශන මාලාව** | | | | |

| | | | |
|---|---|---|---|
| 01. | 2020/04/01 | ගරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා | සිද්ධි අධ්‍යයනය පිළිබඳ සාකච්ඡාව - සිවිල් නීතිය |
| 02. | 2020/04/21 | ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය | **චෝදනා, චෝදනා සංශෝධනය කිරීම සහ චෝදනා එක් කිරීම - I** වන කොටස |
| 03. | 2020/04/27 | ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය | **චෝදනා, චෝදනා සංශෝධනය කිරීම සහ චෝදනා එක් කිරීම - II** වන කොටස |
| 04. | 2020/04/28 | ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය | **ඇප ලබාදීම පිළිබඳ නීතිය සහ භාවිතය** |
| 05. | 2020/04/29 | ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය | **ඇප ලබාදීම පිළිබඳ නීතිය සහ භාවිතය** |
| 06. | 2020/05/04 | ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය | **ඇප ලබාදීම පිළිබඳ නීතිය සහ භාවිතය** |
| 07. | 2020/05/06 | ගරු විනිසුරු බුවනෙක අලුවිහාරේ මැතිතුමා | **සාක්ෂි ඇගයීම** |
| 08. | 2020/05/11 | ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය | **දේපළ නියාදනය**<br><br>**I** වන කොටස |
| 09. | 2020/05/11 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | **අපරාධ විමර්ශන පැවැත්වීම, ආශ්‍රිත නෛතික රාමුව සහ ඒ ආශ්‍රි ත මහේස්ත්‍රාත්වරයාගේ භූමිකාව පිළිබඳ හැඳින්වීමක්.** |
| 10. | 2020/05/12 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | • අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමය සහ අපරාධ විමර්ශන පිළිබඳ හැඳින්වීමක්.<br>• අපරාධ විමර්ශනවල අරමුණු<br>• අපරාධ විමර්ශන නියාමනය කරන නීතිය<br>• **විරුද්ධ අධිකරණ පද්ධතියේ දී (චෝදනාත්මක අධිකරණ පද්ධතියේ දී) මහේස්ත්‍රාත්වරයාගේ භූමිකාව .** |

| | | | |
|---|---|---|---|
| 11. | 2020/05/13 | ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය | **දේපළ නියාදනය**<br><br>**II වන කොටස .** |
| 12. | 2020/05/14 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | • අපරාධ විමර්ශන පවත්වන ආකාරය.<br>• දණ්ඩනී ති සංග්‍රහයේ වරදවල් සම්බන්ධයෙන් අපරාධ විමර්ශන පැවැත්වීම.<br>• අපරාධ විමර්ශන වර්ග.<br>• **අපරාධ විමර්ශනයක මූලික පියවර .** |
| 13. | 2020/05/15 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | • විමර්ශන ආරම්භ කිරීම<br>• **සාක්ෂිකරුවන් සම්මුඛ සාකච්ඡාවට කැඳවීම සහ ප්‍රකාශ සටහන් කරගැනීම.**<br>• අපරාධයක් සිදු වූ ස්ථානය පරීක්ෂා කිරීමේ අපරාධ ස්ථානීය විමර්ශනය<br>• **පරිශ්‍රයකට ඇතුල් වීම සහ පරිශ්‍රය සෝදිසි කිරීම**<br>• පරිශ්‍රයකට ඇතුලු වීම පිළිබඳ නෛතික බලය සහ සෝදිසි වරෙන්තු නිකුත් කිරීම. |
| 14. | 2020/05/18 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | • **සෝදිසි වරෙන්තුව**<br>1. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 68 සහ 70 වන වගන්ති .<br><br>2. ඩිජිටල් මාධ්‍යයේ සෝදිසි කිරීම් සහ පරීක්ෂා.<br><br>• **සිරභාරයට ගැනීම/අත්අඩංගුවට පත්කිරිම**<br>1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) ව්‍යවස්ථාව.<br><br>2. වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම .<br><br>3. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32, 35 සහ 40 වන වගන්ති . |
| 15. | 2020/05/19 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය | • **සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සහ පොලීසිය භාරේ රඳවා තබා ගැනීම.**<br><br>1.පැය 24 ක් අත්අඩංගුවේ තබාගැනීමේ |

| | | | |
|---|---|---|---|
| | | විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | නීතිය සහ ඉන් ඔබ්බට කාලසීමාවක් රඳවා තබාගැනීම.<br><br>2. නඩු තීන්දු නීතිය.<br><br>3. සැකකරුවෙකු සිරභාරයට ගැනීම සහ අත්අඩංගුවට ගැනීම පිණිස පරිශ්‍රයකට ඇතුලු වීම සහ සෝදිසි කිරීම. |
| 16. | 2020/05/21 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | • **ව්‍යෝහාරික /අධිකරණ වෛද්‍ය පරීක්ෂණය**<br>1. අරමුණ<br><br>2. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 122 සහ 123 වන වගන්ති.<br><br>3. අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කිරීම.<br><br>4. මරණ සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය පරීක්ෂණය.<br><br>**5.මරණ සම්බන්ධයෙන් මරණ පරීක්ෂණය**<br><br>**6. මිනී ගොඩගැනීම.**<br><br>**7.පොලිස් භාරයේ රඳවා තබාගැනීමේ දී මරණයට පත්වීම.**<br><br>8. හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්වීමේ දී හදිසි මරණ පරීක්ෂකයෙකුගේ /මහේස්ත්‍රාත්වරයෙකුගේ බලතල<br><br>9. පශ්චාත් මරණ පරීක්ෂණය<br><br>10. මහේස්ත්‍රාත්වරයෙකු විසින් කළයුතු දෑ සහ නොකළ යුතු දෑ . |
| 17. | 2020/05/22 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | **1. සමූහ ආපදාවන් සම්බන්ධ පරීක්ෂාවන්.**<br><br>2. පරීක්ෂණයකට පසු ක්‍රියාපිළිවෙත.<br><br>3. ලේඛන සම්බන්ධ විමර්ශන.<br><br>4. ලේඛනයක් හෝ යම් දෙයක් සපයා දීම පිණිස මහේස්ත්‍රාත්වරයෙකුට සහාය දැක්වීම.<br><br>5. මහේස්ත්‍රාත් නියෝග. |
| 18. | 2020/05/23 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත | • **හඳුනාගැනීමේ පෙරෙට්ටු** |

| | | | |
|---|---|---|---|
| | | කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණි ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී.<br><br>තිලකවර්ධන මැතිණිය විසින් මුලසුන හොබවන ලද සැසිවාරය | 1.හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වීම<br><br>• **සටහන් කර ගැනීම**<br>2. පාපොච්චාරණමය ප්‍රකාශ (ගතයුතු පියවර) |
| 19. | 2020/05/26 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | • සංඥේය නොවන වරදවල් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම.<br>1. වරෙන්තු මත සිර භාරයට ගැනීම2. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 50 සිට 59 දක්වා වගන්ති .<br>3. ප්‍රගති වාර්තා |
| 20. | 2020/05/27 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | • **මහේස්ත්‍රාත් අධිකරණයේ දී සැකකරුවෙකුට එරෙහිව අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම.**<br>1. නඩු කටයුතු ආරම්භ කිරීම සහ නඩු කටයුතු පැවරීම අතර වෙනසග<br><br>2. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115 සහ 116 වන වගන්ති පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනය.<br><br>3. තදනන්තර පියවර සහ විධිවිධාන.<br><br>4. සැක කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි සහ සාධාරණ හේතු. |
| 21. | 2020/05/29 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | • 115 (1) වාර්තාව සහ 116(1) වාර්තාව පිළිබඳ තවදුරටත් හැදෑරීම.<br>• සිද්ධි අධ්‍යයනය |
| 22. | 2020/06/01 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා | සිද්ධි අධ්‍යයනය තවදුරටත්<br><br>**අපරාධ නඩුවල අධිකරණ බලය** |

| | | | |
|---|---|---|---|
| | | ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | |
| 23. | 2020/06/02<br>පෙ.ව.10.45 සිට ප.ව.1.00 දක්වා | වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා, ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී, කොළඹ | **ශ්‍රී ලංකාව තුළ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමයේ දී අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ භූමිකාව.** |
| 24. | 2020/06/02<br>ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | අපරාධ විමර්ශන පිළිබඳ සිද්ධි අධ්‍යයනය සහ මහේස්ත්‍රාත්වරයාගේ භූමිකාව පිළිබඳ සාකච්ඡාව.<br><br>**අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 124 වන වගන්තියේ විෂය පථය .** |
| 25. | 2020/06/04 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | දණ්ඩ නීති සංග්‍රහය යටතේ තේමාගත අධිකරණ බලය.<br><br>**දණ්ඩ නීති සංග්‍රහය යටතේ ප්‍රාදේශීය අධිකරණ බලය - දණ්ඩ නීති සංග්‍රහයේ 2 වන වගන්තිය .**<br><br>ගරු අධිකරණයට අපහාස කිරීමේ වරද. |
| 26. | 2020/06/08 | වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා, ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී, කොළඹ | **ශ්‍රී ලංකාව තුළ අපරාධ යුක්ති ය පසිඳලීමේ ක්‍රමයේ දී අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ භූමිකාව - 2 වන කොටස** |
| 27. | 2020/06/09 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | **ශ්‍රී ලංකාවේ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත .** |
| 28. | 2020/06/10 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය | **අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් -1 වන කොටස** |

| | | | |
|---|---|---|---|
| | | විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | |
| 29. | 2020/06/11 | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | **අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් - 2 වන කොටස** |
| 30. | 2020/06/12 | රංග දිසානායක මහතා<br><br>ලංකා ජයරත්න මහත්මිය<br><br>ගරු විනිසුරු එල්ටීබී දෙහිදෙනිය මහතා සහ ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | ශ්‍රී ලංකාව තුළ සිදු වූ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට විශේෂ අවධානය යොමු කරමින් **සමූහ ජනසංහාරයන් පිළිබඳව සිදුකරන පරීක්ෂාවන්** සම්බන්ධයෙන් අත්දැකීම් හුවමාරු කර ගැනීම.<br><br>මහේස්ත්‍රාත්වරයාගේ භූමිකාව තුළ ප්‍රායෝගික ගැටලු සාකච්ඡා කිරීම. |
| 31. | 2020/06/15<br><br>ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වන ලද දේශනයකි. | ජනාධිපති නීතිඥ ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br><br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත යටතේ සාක්ෂිකරුවන්ගේ හිමිකම්. |
| 32. | 2020/06/16 | 1. විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. ගරු විනිසුරු අර්ජුන ඔබේසේකර මැතිතුමා විසින් පවත්වන දේශනය | බැංකු නීතිය |
| 33. | 2020/06/17 | 1. ගරු විනිසුරු සලාම් මැතිතුමා විසින් පවත්වන ලද දේශනය | සිවිල් නඩු විධාන සංග්‍රහය |
| 34. | 2020/06/18 | 1. විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. ගරු විනිසුරු කුමුදුනි වික්‍රමසිංහ මැතිණිය විසින් පවත්වන ලද දේශනය | පරිගණක අපරාධ ව්‍යවස්ථා |
| 35. | 2020/06/19 | 1.ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා විසින් පවත්වන ලද දේශනය<br>2.වෛද්‍ය සම්පත් පුංචිහේවා මහතා විසින් පවත්වන ලද දේශනය | 1. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත<br>2. පර්යේෂණ ක්‍රමවේද |
| 36. | 2020/06/22 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2.පෙරින්පනායගම් මහතා විසින් පවත්වන ලද දේශනය | මෝටර් රථ වාහන පනත |
| 37. | 2020/06/23 | 1. විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව | තෙස්තමේන්තු නඩු කාර්යපටිපාටිය |

| | | | |
|---|---|---|---|
| | | 2. ගරු විනිසුරු ෆෑන්ක් ගුණවර්ධන මහතා විසින් පවත්වන ලද දේශනය | |
| 38. | 2020/6/24 | 1. විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. CYPO පිළිබඳ දේශනය - ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වන ලද දේශනය | ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිනිය සහ විශ්‍රාමලත් අයිජී සිරිවර්ධන මහතා |
| 39. | 2020/6/25 | 1. විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. ගරු විනිසුර ප්‍රියන්ත ප්‍රනාන්දු මැතිතුමා විසින් පවත්වන දේශනය | මහේස්ත්‍රාත් අධිකරණයක ක්‍රියාකලාපය සහ කාර්යපටිපාටිය සහ පරිපාලනය ආශ්‍රිත ගැටලු. |
| 40. | 2020/06/26 | 1. ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා විසින් පවත්වන දේශනය<br>2. ගරු විනිසුරු ෆෑන්ක් ගුණවර්ධන මැතිතුමා | 1.සාක්ෂිකරුවන් විමසීම: මාර්ගෝපදේශ සහ විධිවිධාන.<br>2.විශ්වසනීයත්වය සහ සාක්ෂි විශ්වසනීයත්වය ඇගයීම.<br>3. ප්‍රති දෝෂමුක්ත නඩුකර, හිමිකම ප්‍රකාශ කිරීමේ නඩු, මායිම් පිළිබඳ අර්ථ නිරූපණ නඩුකර, නිදහස් කිරීමට නැඹුරු නඩුකර පිළිබඳ විවාදිත අධිකරණ |
| 41. | 2020/06/29 | 1. විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් පවත්වන දේශනය | ළමා යුක්තිය පසිඳලීමේ ක්‍රමය: ළමයා සහ අනාරක්ෂිත සාක්ෂිකරුවන් සහ ළමයින්ගේ සාක්ෂි. |
| 42. | 2020/06/30 | 1.මහාචාර්ය ජීන් පෙරේරා විසින් පවත්වන ලද දේශනය<br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී.<br>2. ගරු ෆෑන්ක් ගුණවර්ධන මැතිතුමා | 1. ලිංගික අපරාධ සම්බන්ධ වෛද්‍ය නෛතික පැතිකඩ<br>2. පූර්ව නඩු විභාග අදියරේ දී පිළිගැනීම් වාර්තා කිරීම, නඩු ලිවීම තෙක් සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ සාක්ෂි පිළිගැනීම සහ නඩු විභාගයක් පවත්වාගෙන යාම. |
| 43. | 2020/07/01 | 1.ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා විසින් පවත්වන ලද දේශනය.<br>2.ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් පවත්වන ලද දේශනය. | 1. ප්‍රාථමික අධිකරණ නඩු විධාන සංග්‍රහය පනත යටතේ 66 වන වගන්තියේ නඩු.<br>2. මානව අයිතිවාසිකම් සහ සාධාරණත්වය |
| 44. | 2020/07/02 | 1. විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2.ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් පවත්වන ලද දේශනය. | නඩු තීන්දු ලිවීම |
| 45. | 2020/07/03 | 1. ගරු විනිසුරු ජනක ද සිල්වා මැතිතුමා විසින් පවත්වන ලද දේශනය. | රජයේ ඉඩම් (සන්තකය ආපසු |

| | | | |
|---|---|---|---|
| | | 2.ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් පවත්වන ලද දේශනය. | ලබාගැනීමේ) පනත පිළිබඳ නීතිය.<br><br>නඩු තීන්දු ලිවීම |
| 46. | 2020/07/06 | 1. විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br><br>2.ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් පවත්වන ලද දේශනය. | නඩු තීන්දු ලිවීම |
| 47. | 2020/07/07 | 1. කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලය නැරඹීම:<br>චතුර අමරතුංග මහතා<br>ක්‍රිෂාන්ත මහතා<br>අජිත් මහතා<br>ඕෂධ මහතා<br>දේවිකා මහත්මිය<br>ප්‍රදීප් මහතා<br>2. අනෙකුත් විනිශ්චයකාරවරුන් විසින් විනිශ්චයාසන පුහුණුව<br>3. ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් පවත්වන ලද දේශනය. | වෛද්‍ය අජිත් තෙන්නකෝන්<br><br>පරිසර නීතිය |
| 48. | 2020/07/08 | 1. ගරු විනිසුරු ශිරාණි තිලකවර්ධන මැතිණිය විසින් පවත්වන ලද දේශනය.<br><br>2. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් පවත්වන ලද දේශනය. | පරිසර නීතිය<br><br>අධිකරණ පරිපාලනය සහ මූල්‍ය කටයුතු මෙහෙය වීම. |
| 49. | 2020/0709 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව සහ<br><br>2.කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලය නැරඹීම:<br>සුමුදු මහතා<br>නුතෙයිනන් මහතා<br>මධුශිකා මහත්මිය<br>සම්රුත් මහත්මිය<br>ශශිකා මහත්මිය<br>3.ගරු විනිසුරු ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා විසින් පවත්වන ලද දේශනය. | වෛද්‍ය අජිත් තෙන්නකෝන්<br><br>මහේස්ත්‍රාත්වරුන් සඳහා දණ්ඩණය |

| | | | |
|---|---|---|---|
| | | | පිළිබඳ මාර්ගෝපදේශ |
| 50. | 2020/07/10 | 1.සාක්ෂිකරුවන් විමසීම: මාර්ගෝපදේශ සහ විධිවිධාන.<br>2.විශ්වසනීයභාවය සහ සාක්ෂිවල විශ්වසනීයත්වය ඇගයීම.<br>3.ඒකාබද්ධ අධිකරණයක දී, විවාදිත අධිකරණය.<br>4.ගරු අධ්‍යක්ෂතුමා විසින් කරන ලද විශේෂ දේශනය (නුවන් කෞශල්‍යා මහතා 2020/07/13 වන දින මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ රාජකාරි කටයුතු භාරගැනීම.) | ගරු විනිසුරු යසන්ත කෝදාගොඩ මැතිතුමා<br>ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා<br>ගරු විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය මැතිතුමා |
| 51. | 2020/07/13 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. විවාදිත අධිකරණය. | විවාදිත අධිකරණය - ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 52. | 2020/07/14 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2.නිලධාරි පන්තියේ අපරාධවල දී සාක්සි විශ්ලේෂණය කිරීම පිළිබඳව පවත්වන ලද දේශනය | ගරු විනිසුරු බුවනෙක අළුවිහාරේ මැතිතුමා |
| 53. | 2020/07/15 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2.නිවසේ නැවති, චෝදනා නැවත ගොනු කිරීම සහ නඩු තීන්දු ලිවීම පිළිබද පැවරුම් නිමකිරීම. | |
| 54. | 2020/07/16 | නිවසේ නැවති, චෝදනා නැවත ගොනු කිරීම සහ නඩු තීන්දු ලිවීම පිළිබද පැවරුම් නිමකිරීම. | |
| 55. | 2020/07/17 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. විවාදිත අධිකරණය. | |
| 56. | 2020/07/20 | විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව | |
| 57. | 2020/07/21 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. උත්තරවාද සංශෝධනය කිරීම පිළිබඳ විවාදිත අධිකරණය. | ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 58. | 2020/07/22 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව | ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන |

| | | | |
|---|---|---|---|
| | | 2. නඩු තීන්දු ලිවීම පිළිබඳව පවත්වන ලද දේශනය | මැතිතුමා |
| 59. | 2020/07/23 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. සිවිල් නඩුකරවල දී සාක්ෂි ඇගයීම පිළිබඳව පවත්වන ලද දේශනය | ගරු විනිසුරු ෆ්‍රෑන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 60. | 2020/07/27 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. සිවිල් නඩුකරවල දී නඩු තීන්දු ඇගයීම පිළිබඳව පවත්වන ලද දේශනය | ගරු විනිසුරු ෆ්‍රෑන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 61. | 2020/07/28 | විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව | |
| 62. | 2020/07/29 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. සිවිල් නඩුකරවල දී නඩු තීන්දු ඇගයීම පිළිබඳව පවත්වන ලද දේශනය | ගරු විනිසුරු ෆ්‍රෑන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 63. | 2020/07/30 | 1.විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව<br>2. සිවිල් නඩුකරවල දී නඩු තීන්දු ඇගයීම පිළිබඳව පවත්වන ලද දේශනය | ගරු විනිසුරු ෆ්‍රෑන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 64. | 2020/07/31 | විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව | |
| 65. | 2020/08/04 | උපද්‍රව සහ ප්‍රතිකර්ම පිළිබඳව තීරණ ගැනීම සම්බන්ධයෙන් පවත්වන ලද දේශනය | ආචාර්ය එරෝල් වීරසිංහ මහතා<br>ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය විසින් සැසිවාරයේ මුලසුන හොබවන ලදී. |
| 66. | 2020/08/05 | විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව | |
| 67. | 2020/08/06 | විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව | |
| 68. | 2020/08/07 | විනිශ්චයාසනය පිළිබඳව පුහුණුව | |
| 69. | 2020/08/12 | ආචාර විධි සම්බන්ධයෙන් පවත්වන ලද දේශනය | |

| | | | |
|---|---|---|---|
| 70. | 2020/08/ 19 | මුදල් අයකරගැනීමේ නඩුකර පිළිබඳව පූර්ව නඩු විභාග සම්බන්ධයෙන් පවත්වන ලද දේශනය - 1 වන කොටස | ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 71. | 2020/08/21 | මුදල් අයකරගැනීමේ නඩුකර පිළිබඳව පූර්ව නඩු විභාග සම්බන්ධයෙන් පවත්වන ලද දේශනය - 2 වන කොටස | ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 72. | 2020/08/24 | සිවිල් නඩු කාර්ය පටිපාටිය සහ අධිකරණය චර්යා ධර්ම සම්බන්ධයෙන් පවත්වන ලද දේශනය | ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 73. | 2020/08/25 | ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණය සම්බන්ධයෙන් පවත්වන ලද දේශනය | ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 74. | 2020/08/26 | බැංකු නීතිය සම්බන්ධයෙන් පවත්වන ලද දේශනය | ගරු විනිසුරු අර්ජුන ඔබේසේකර මැතිතුමා |
| 75. | 2020/08/27 | | ගරු විනිසුරු මහින්ද සමයවර්ධන මැතිතුමා |
| 76. | 2020/09/02 | බාලවයස්කරුවන්ගේ දේපළ සම්බන්ධයෙන් භාරකාරත්වය | ගරු විනිසුරු ෆ්‍රැන්ක් ගුණවර්ධන මැතිතුමා |
| 77. | 2020/09/03 | පූර්ව නඩු විභාග සංකල්පය | ගරු විනිසුරු රුවන් ප්‍රනාන්දු මැතිතුමා |
| 78. | 2020/09/10 | පරිගණක අපරාධ පනතේ කාර්ය පටිපාටික පැතිකඩt. | ගරු විනිසුරු ශිරාන් ගුණරත්න මැතිතුමා |
| 79. | 2020/09/15 | ගුණ සහ නුගුණ විනිශ්චයකාරවරයා | ගරු විනිසුරු ශිරාණී තිලකවර්ධන මැතිණිය |
| 80. | 2020/09/17 | විද්‍යුත් නීතිය | ජන්සෙන් මහතා |

## අධිකරණ නිලධාරීන් සඳහා ව්‍යවහාරික කටයුතු උදෙසා සන්නිවේදන කුසලතා පාඨමාලාව

ශ්‍රී ලංකාව පුරා සිටින විනිශ්චයකරුවන්ට දේශීය සන්දර්භය තුළ ඔවුන්ගේ පොදු භාෂාමය කථන කුසලතාව වැඩිදියුණු කිරීමට මෙන්ම විධිමත් නඩු තීන්දු ඉදිරිපත් කිරීම පිණිම මෙන්ම ශාස්ත්‍රීය සඟරාවලට සහ වෘත්තීය ලිපි ලේඛනවලට දායක වීම පිණිස ඔවුන්ගේ ලිවීමේ භාෂාමය කුසලතාවන් වර්ධනය කිරීම ඉලක්ක කරගෙන "ව්‍යවහාරික කටයුතු සඳහා සන්නිවේදන කුසලතා පාඨමාලාව" ආරම්භ කර ඇත.

මෙම පාඨමාලාව ආයතනය තුළ දී ආරම්භ කරන ලද අතර, කොවිඩ් - 19 වසංගතයනිසා එය ඉක්බිතිව ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී

## වෙනත් වැඩමුළු

1. **<u>අරමුණුගත කණ්ඩායම් සාකච්ඡාව - ළමයින් සම්බන්ධ නඩුකරවල දී විනිශ්චය කිරීමේ කාර්ය සඳහා වැඩිම යහපත සලසන පරිචයන් සහ මාර්ගෝපදේශ</u>**

ළමයින් සම්බන්ධ නඩුකරවල දී විනිශ්චය කිරීමේ කාර්ය සඳහා වැඩිම යහපත සලසන පරිචයන් සහ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමේ අරමුණෙන් යුක්තව, ඉහත කී කණ්ඩායම් සාකච්ඡා මාලාව, ජාත්‍යන්තර සාමය සහ නීතියේ ආධිපත්‍ය පිළිබඳ මැක්ස් ප්ලෑනක් පදනමේ (Max Planck Foundation with International Peace and the Rule of Law) සහයෝගිතාව ඇතිව, මහාධිකරණ විනිශ්චයකාරවරුන්, දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්, අධිකරණ වෛද්‍ය නිලධාරීන්, පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතිව, ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

2. **<u>අරමුණුගත කණ්ඩායම් සාකච්ඡාව - ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා පුහුණු අවශ්‍යතා විශ්ලේෂණ</u>**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ විෂය මාලාව සංවර්ධනය කිරීම පිණිස, ඉහත කී කණ්ඩායම් සාකච්ඡා මාලාව, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනයේ මධ්‍යම අධිකරණ වැඩසටහනේ (USAID Core Justice Program) සහයෝගිතාව ඇතිව, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

3. **<u>පරිගණක අපරාධ සහ ඉලෙක්ට්‍රොනික සාක්ෂි පිළිබඳව ජාතික අධිකරණ පුහුණුකරුවන්ගේ දෙවැන රැස්වීම - 2020 නොවැම්බර් මස 17 වන දින</u>**

ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වන ලද මෙම ඔන්ලයින් සම්මේලනය, Council of Europe

GLACY+ Project ව්‍යාපෘතිය විසින් 2020.11.17 වන දින ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පවත්වන ලද මෙම සම්මේලනයට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් වන ගරු විජිත කුමාර මලල්ගොඩ, ගරු ප්‍රීති පද්මන් සූරසේන සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාර ද සහභාගී වී ඇත.

### 4. <u>කොවිඩ් - 19 වසංගත තත්ත්වය පැවති කාලය තුළ දී කෙටිකාලීන ඩිජිටල් සේවා විසඳුම්</u>

මෙම වැඩසටහන, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගරු විනිශ්චයකාරවරුන්ගේ සහභාගීත්වය ඇතිව, ගරු අගවිනිසුරුතුමා සහ ගරු අධිකරණ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2020.11.25 වන දින ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ශ්‍රවනාගාරයේ දී පවත්වන ලදී.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය පැවතීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අපේක්ෂා කළ පරිදි සම්පූර්ණ කරගැනීමට නොහැකි වූ බැවින්, එම සැලැස්ම 2021 වර්ෂයේ දී සම්පූර්ණ කරගැනීමට සැලසුම් කර ඇත. එමෙන්ම, සේවයේ නිරතව සිටින විනිසුරුවරුන් සඳහා ඔන්ලයින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළමණාකරන මණ්ඩලය විසින් අනුමත කර ඇත.

## කැපී පෙනෙන ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අදාළ මුල්‍ය ප්‍රකාශ සාමාන්‍යයෙන් පිළිගෙන ප්‍රතිස්ථාපිතව තිබෙන ගිණුම්කරන මූලධර්මවලට අනුව සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ගණකාධිකාරිවරුන් විසින් නියම කරන ලද ගිණුම්කරණ සම්මතයන් පදනම් කරගෙන සකස් කරනු ලැබේ.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | සටහන් | **2020** | | **2019 - නැව සඳහන් කරන ලද** |
|---|---|---|---|---|
| | | **රු.පි.ශත** | **රු.පි.ශත** | **රු.පි.ශත** |
| **<u>වත්කම්</u>** | | | | |
| පුනරාවර්තන නොවන වත්කම් | **3** | | 5,613,989.08 | 16,372,613.88 |
| නෛතික දත්ත සංහිතාව | | | 3,517,995.00 | 3,517,995.00 |
| **<u>පුනරාවර්තන වත්කම්</u>** | | | | |
| තොග (කාර්යාල ලිපි ද්‍රව්‍ය) | | 702,871.95 | | 796,747.20 |
| අවිනිශ්චිත ගිණුම | **4** | 7,142,089.51 | | |
| අත්පිට මුදල් සහ අත්පිට මුදල්වලට සමාන | **5** | 324,862.48 | | 7,455,281.17 |
| | | | 8,169,823.94 | 8,252,028.37 |
| | | | **<u>17,301,808.02</u>** | **<u>28,142,637.25</u>** |
| **<u>මූල්‍යකරණයන් කළේ ප්‍රාග්ධන සහ ලැබීම්</u>** | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 18,705,843.70 | | 18,305,662.20 |
| සමුච්චිත අරමුදල | **6** | 6,846,692.14 | | 17,198,480.67 |
| අඩු කළා - වසර තුළ හිගය | | (10,614,763.11) | 14,937,772.73 | (10,630,888.53) |
| | | | | 24,873,254.34 |
| **<u>පුනරාවර්තන බැරකම්</u>** | | | | |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | | 658,752.00 | | 560,445.00 |
| මුද්දර ගාස්තු සඳහා ප්‍රතිපාදන | | 1,850.00 | | 2,300.00 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **7** | 888,915.00 | | 741,536.00 |
| උපචිත වියදම් | **8** | 362,369.93 | | 498,032.92 |
| වෙනත් ගෙවීම් | **9** | 439,711.34 | 2,364,035.29 | 1,467,068.99 |
| කාර්ය මණ්ඩලය ආශ්‍රිත ගෙවීම් | | 12,437.02 | | |
| | | | | 3,269,382.91 |
| | | | **17,301,808.02** | **28,142,637.25** |

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ සම්මතයන්ට අනුව සකස් කොට ඉදිරිපත් කර ඇත.පිටු අංක 05 සහ 06 හි දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ පිටු අංක 08 සිට 13 දක්වා දැක්වෙන සටහන් වනාහි මෙම මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය කොටසක් වශයෙන් සැළකුව මැනවි.

අත්සන් කළා/අත්සන
යූ.වී.ආර්. රාජකරුණා
ගණකාධිකාරී
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

අත්සන් කළා/අත්සන
ගරු.ඩී.එෆ්.එච්. ගුණවර්ධන,
වැඩ බලන අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
2019 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබද ප්‍රකාශය

| | සටහන් | 2019 | | 2018 නැවත සදහන් කිරීම |
|---|---|---|---|---|
| | | රුපි.ශත | රුපි.ශත | රුපි.ශත |
| ආදායම | | | | |
| පුනරාවර්තන ප්‍රදාන ලැබීම් | 10 | 15,112,014.85 | | 68,985,443.90 |
| ඉතිරි කිරීමේ ගිණුමෙන් ලැබුණු පොළිය | | 11,670.82 | | 11,659.63 |
| විලම්බිත ආදායම | | - | | 11,422.03 |
| රජයේ ප්‍රදාන ණය හිලව් කිරීම | | - | | 177.97 |
| ජායා පිටපත් ආදායම | | - | | 7,632.74 |
| වෙනත් ආදායම් | 11 | 38,710.00 | | 9,009.00 |
| වෙන්දේසි | | | 15,162,395.67 | 69,025,3336.27 |
| මුළු ආදායම | | | | |
| අඩුකළා වියදම | | | | |
| වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ | | | | |
| වැටුප් හා වේතන | 12 | 5,988.627.48 | | 5,743,871.54 |
| සේවක අර්ථසාධක අරමුදල් වියදම් | | 616,273.28 | | 541,044.58 |
| සේවක භාරකාර අරමුදල් වියදම් | | 154,068.31 | | 135,261.15 |
| කාර්යමණ්ඩල පුහුණුවීම් | | 12,000.00 | | 145,500.00 |
| අතිකාල | | 97,412.27 | | 299,101.16 |
| සංයුක්ත දීමනා/වෘත්තීමය දීමනා | | - | | 81,000.00 |
| වෙනත් දීමනා | | 105,984.71 | | 4,000.00 |
| පාරිතෝෂික | | 147,379.00 | | 197,981.60 |
| | | | | 7,147.760.03 |
| | | | 7,121.745.05 | |
| මෙහෙයුම් කටයුතු | | | | |
| සම්මන්ත්‍රණ හා පුහුණු වියදම් | 13 | 1,340,569.00 | | 11,891,900.82 |
| විදෙස් පුහුණු වැඩසටහන් වියදම් | 14 | 557,567.94 | | 41,066,377.13 |
| සම්මන්ත්‍රණ හා වෙනත් වැඩමුළු සඳහා තේ පැන් සංග්‍රහ වියදම් | | - | | |
| | | | | 171,366.00 |
| ආරක්ෂක ගාස්තු | | 1,143,865.41 | | 931,372.82 |
| වාර්ෂික දායක මුදල් ගාස්තු | 15 | 538,500.00 | | 314,125.00 |
| | | | 3,580,502.35 | 54,375,141.77 |
| සැපයුම් හා භාවිත කළ පාරිභෝජකයන් | | | | |
| පුවත්පත් සැපයීම් | | | | |
| තැපැල් ගාස්තු | | 14,240.00 | | 29,275.00 |
| කාර්යාල ලිපිද්‍රව්‍ය වියදම් | | 115,580.25 | | 310,421.50 |
| මුද්‍රණ වියදම් | | 783,937.60 | | 153,900.00 |
| ඉන්ධන | | 105,903.00 | | 84,387.64 |
| වෙනත් සේවා සහ සැපයුම් | | 203,575.39 | | 852,549.68 |
| | | | 1,223,236.24 | 1,430,533.82 |
| මූල්‍ය පිරිවැය | | 4,250.00 | 4,250.00 | 3,750.00 |
| බැංකු ගාස්තු | | | | |
| වෙනත් වියදම් | | | | |
| ගමන් වියදම් | | 1,968.29 | | 31,440.82 |
| වාහන නඩත්තුව | | 40,438.26 | | 71,661.71 |

| | | | | |
|---|---|---|---|---|
| ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව | 16 | | | |
| පරිවර්තන ගාස්තු | | 522,188.54 | | 594,069.13 |
| | | 5,545.00 | | 86,890.00 |
| පරිගණක නඩත්තු | | - | | - |
| දුරකථන හා අන්තර්ජාල ගාස්තු | | 520,860.58 | | 1,163,842.23 |
| පවිත්‍රතා වියදම් | | 656,200.00 | | 613,161.00 |
| විදුලි සැපයුම් සහ ජල සැපයුම් වියදම් | | 546,111.17 | | 795,109.44 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් | 17 | 11,158,806.30 | | 12,983,494.85) |
| විගණන ගාස්තු | | 395,307.00 | | 359,370.00 |
| | | | 13,847,425.14 | |
| <u>මුළු වියදම්</u> | | | | 16,699,039.18 |
| | | | 25,777,158.78 | 79,656,224.80 |
| සමුච්චිත අරමුදලට අතිරික්තය (හිඟය) | | | **(13,847,425.14)** | (10,630,888.53) |

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කෙටුම්පත් කළ මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2020 | | 2019 | |
|---|---|---|---|---|---|
| | | රුපි.ශත | රුපි.ශත | රුපි.ශත | රුපි.ශත |
| මෙහෙයුම් කටයුතු: | | | | | |
| ලැබීම් | | | | | |
| අමාත්‍යාංශයෙන් ලැබුණු පුනරාවර්තන අග්‍රිම | | 14,088,327.95 | | 68,201,934.46 | |
| ලැබුණු පොළිය | | 11,670.82 | | 11,659.63 | |
| අයවැය වෙන්කිරීම් -228 | | - | | - | |
| පරිත්‍යාග | | - | | - | |
| පුස්තකාල දඩ මුදල් | | - | | - | |
| ජායාපිටපත් ගාස්තු ආදායම | | - | | 7,632.74 | |
| පසුගිය වර්ෂයට අදාළ චෙක්පත් අවලංගු | | 779,100.00 | | - | |
| නවාතැන් සැපයුම් ආදායම් | | - | | - | |
| chemonic int වෙතින ලද අත්පිට මුදල් | | - | | - | |
| වෙනත් ආදායම් | | 40,000.00 | | 9,000.00 | |
| චන්ඩිගාර් අධිකරණ ඇකඩමියේ ගෙවීම් සඳහා අත්පිට මුදල් | | - | | | |
| මෙහෙයුම් කටයුතු වලින් අත්පිට මුදල් ප්‍රවාහය | | | 14,419,098.77 | | 68,230,226.83 |
| ගෙවීම් | | | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 18 | (6,919,313.96) | | (7,091,788.48) | |
| මෙහෙයුම් කටයුතු | 19 | (4,427,259.27) | | (54,122,903.02) | |
| සැපයුම් හා භාවිත පාරිභෝජකයන් | 20 | (3,052,504.72) | | (4,012,103.12) | |
| පසුගිය වර්ෂයට අදාළ චෙක්පත් | | - | | 63,407.10 | |
| අවලංගු මූල්‍ය පිරිවැය | 21 | (4,250.00) | | (3,750.00) | |
| මුද්දර ගාස්තු | | (4,100.00) | | (4,425.00) | |
| මෙහෙයුම් කටයුතු වලින් අත්පිට මුදල් බැහැරට ප්‍රවාහය | | | (14,407,427.95) | | (65,171,662.52) |
| **මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ගලනය** | | | 11,670.82 | | 30,058,564.31 |
| **මූල්‍ය කටයුතු වලින් අත්පිට මුදල් ප්‍රවාහය** | | | | | |
| ප්‍රග්ධන ප්‍රදාන ලැබීම් | | 400,181.50 | 400,181.50 | 1,291,309.99 | 1,291,309.99 |
| මූල්‍ය කටයුතු වලින් ශුද්ධ අත්පිට මුදල් ප්‍රවාහය | | | | | |
| **ආයෝජන කටයුතු වලින් අත්පිට මුදල් ප්‍රවාහය** | | | | | |
| ස්ථාවර වත්කම් මිල දී ගැනීම | 22 | (400,181.50) | | (11,600.00) | |
| නීති දත්ත සංහිතාව | | | | | |
| පොලී ආදායම් ප්‍රති ආයෝජනය | | | | | |
| **ආයෝජන කටයුතු වලින් ශුද්ධ අත්පිට මුදල් ප්‍රවාහය** | | | (400,181.50) | | (11,600.00) |

| | | | | | |
|---|---|---|---|---|---|
| අත්පිට මුදල් හා අත්පිට මුදල් තුල්‍යයන්ගේ ශුද්ධ වැඩිවීම | | | 11,670.82 | | 4,338,274.30 |
| කාලසීමාව ආරම්භයේ අත්පිට මුදල් හා අත්පිට මුදල් තුලනයන් | | | 313,191.66 | | 3,117,006.87 |
| කාලසීමා අවසානයේ අත්පිට මුදල් හා අත්පිට මුදල් තුලනයන් | | | 324,862.48 | | 7,455,281.17 |

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වු වර්ෂය සඳහා කෙටුම්පත් කළ ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | දායක ප්‍රාග්ධනය | වෙනත් සංචිත | සමුච්චිත අතිරික්තය (හිඟය) | එකතුව (රු.) |
|---|---|---|---|---|
| | | | | |
| 2020.01.01 දිනට ශේෂය | 18,305,662.20 | | 6,567,592.14 | 24,873,254.34 |
| | | | | |
| වර්ෂය සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | 400,181.50 | | - | 400,181.50 |
| පෙර වර්ෂයේ ගැළපුම් | - | | 279,100.00 | 279,100.00 |
| වර්ෂය ඇතුළත අතිරික්තය/(හිගය) | - | | (10,614,763.11) | (10,614,763.11) |
| 2012.31 වන දිනට ශේෂය | 18,705,843.70 | - | (3,768,070.97) | 14,937,772.73 |

<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

**<u>2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා</u>**

1. මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කරන සියළුම වටිනාකම් අන්‍යාකාරයෙන් ප්‍රකාශ කර ඇත්නම් මිස ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්වේ.

2. උද්ධමනමය සාධකයන් සඳහා ගැළපීම් සිදුකරනු නොලැබේ.

**තොගවල වටිනාකම**

3. අතීත පිරිවැයට තොගවල වටිනාකම දක්වනු ලැබේ.

**වගකීම් සහ ප්‍රතිපාදන**

4. මූල්‍ය ප්‍රකාශ තුළ විශ්‍රාමික පාරිතෝෂික සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන් ප්‍රකාරව ප්‍රතිපාදන සිදුකර ඇත. වගකීම් සඳහා බාහිරව අරමුදල් සම්පාදනය කරනු නොලැබේ.

**දේපළ පිරියත සහ උපකරණ**

5. දේපළ පිරියත සහ උපකරණ, පහත නිශ්චිතව සඳහන් පදනම සඳහා විධිවිධාන සලසන, සමුච්චිත ක්ෂයවීම් අඩුකර, පිරිවැය වාර්තාගත කරනු ලැබේ.

**ක්ෂයවීම්**

6. ක්ෂයවීම් සඳහා වන ප්‍රතිපාදන, සියළුම දේපළ පිරියත සහ උපකරණවල පිරිවැය මත ගණනය කරනු ලැබේ. අත්කර ගැනීම කළ දේපළ පිරියත සහ උපකරණ, ඒවා ප්‍රයෝජනයට ගතහැකි ඇස්තමේන්තුගත ජීවිත කාලය සලකා, වත්කම් ලබාගැනීමට තිබෙන දිනයේ ක්ෂයවීම් වේ.

පහත සඳහන් අනුපාතයන්ට, ඍජු රේඛා පදනමක් මත පිහිටා සපයන ස්ථාවර වත්කම් ක්ෂයවීම්;

| | |
|---|---|
| කාර්යාලයීය උපකරණ | 20% |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 12.5% |
| පුස්තකාල පොත් | 10% |
| පරිගණක උපකරණ | 25% |
| විදුලි උපකරණ | 20% |
| පැන්ට්‍රි අයිතමයන් | 12.5% |
| ගමන් මලු | 10% |
| යන්ත්‍රසූත්‍ර | 12.5% |

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන්

**01 වන සටහන - ආයතනික තොරතුරු**

**වාර්තාකරන අස්ථිත්වය**

වාර්තාකරන අස්ථිත්වය වන්නේ 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතෙන් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වේ.

**02 වන සටහන - සකස් කිරීමේ පදනම සහ වෙනත් සැළකිය යුතු ගිණුම්කරන ප්‍රතිපත්ති**

**සකස් කිරීමේ පදනම**

- **අනුකූලතා ප්‍රකාශය**

2020 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, නිකුත් කළ ව්‍යාපාර කොටස්වල අගය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය, 2019 දෙසැම්බර් මස 31 වන දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ සම්මතයන්ට (SLPSAS) අනුකූල සියළුම වැදගත් පැතිකඩ.

- **එලදායි ව්‍යාපාරය**

ආයතනයට එලදායි ආයතනයක් ඇතැයි සළකා ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇත.

- **ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අනුකූලතාව**

මූල්‍ය ප්‍රකාශවල සඳහන් ඇතැම් ශේෂයන් මූල්‍ය ප්‍රකාශ මනාව ඉදිරිපත් කිරීම පිණිස නැවත ගැළපුම් කිරීම/තුලනාත්මක සංඛ්‍යා සමඟ වර්ගීකරණය කිරීම සිදුකර ඇත.

- **මූල්‍ය වර්ෂය**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය ප්‍රකාශ 2020 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් වන මාස දොළහක කාලසීමාවක් සඳහා සකස්කර ඇත.

- **සක්‍රීය සහ වාර්තා කිරීමේ වලංගු මුදල් ඉදිරිපත් කිරීම**

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් සකස්කර ඇත.

- **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට පසු සිදුවීම්**

සියළුම වැදගත් පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සැළකිල්ලට භාජනය කර ඇත. සුදුසු අවස්ථාවල දී, එක්කෝ ගැළපුම් සිදුකර ඇති අතර, නොඑසේනම් ප්‍රමාණවත් පරිදි මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය
2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන්

## 03 වන සටහන - දේපළ, පිරියත සහ උපකරණ උපලේඛනය

| **පිරිවැය** | 2020 ජනවාරි මස 01 වන දිනට **ශේෂය** | **වර්ෂය තුළ එකතු කිරීම්** | **වර්ෂය තුළ බැහැරකිරීම්** | 2020 දෙසැම්බර් මස 31 වන දිනට **ශේෂය** | 2019 දෙසැම්බර් මස 31 වන දිනට **ශේෂය** |
|---|---|---|---|---|---|
| කාර්යාල උපකරණ | 1,522,454.25 | - | - | 1,522,454.25 | 1,522,454.25 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 3,056,725.30 | - | - | 3,056,725.30 | 3,056,725.30 |
| පුස්තකාල පොත් | 6,952,926. 90 | 400,181.50 | - | 7,363,108. 40 | 6,952,926. 90 |
| පරිගණක උපකරණ | 44,659,012.49 | - | - | 44,659,012.49 | 44,659,012.49 |
| විදුලි උපකරණ | 1,364,437.73 | - | - | 1,364,437.73 | 1,364,437.73 |
| පැන්ට්‍රි අයිතම | 121,858.33 | - | - | 121,858.33 | 121,858.33 |
| ගමන් බෑග් | 20,100.00 | - | - | 20,100.00 | 20,100.00 |
| යන්ත්‍රෝපකරණ | 1,266,905.00 | - | - | 1,266,905.00 | 1,266,905.00 |
| | **58,964,420.00** | 400,181.50 | **-** | **59,364,601.50** | **58,964,420.00** |

| **ක්ෂයවීම්** | 2020 ජනවාරි මස 01 වන දිනට **ශේෂය** | **වර්ෂය තුළ ක්ෂයවීම්** | **වර්ෂය තුළ බැහැරකිරීම්** | 2020 දෙසැම්බර් මස 31 වන දිනට **ශේෂය** | 2019 දෙසැම්බර් මස 31 වන දිනට **ශේෂය** |
|---|---|---|---|---|---|
| කාර්යාල උපකරණ | 1,522,454.25 | - | - | 1,522,454.25 | 1,522,454.25 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 1,826,448.06 | 382,090.66 | - | 2,208,538.72 | 1,826,448.06 |
| පුස්තකාල පොත් | 2,479,425.26 | 725,443.35 | - | 3,204,868.61 | 2,479,425.26 |
| පරිගණක උපකරණ | 34,876,400.30 | 9,782,612.19 | - | 44,659,012.49 | 34,876,400.30 |
| විදුලි උපකරණ | 1,271,383.05 | 93,054.68 | - | 1,364,437.73 | 1,271,383.05 |
| පැන්ට්‍රි අයිතම | 75,411.65 | 15,232.29 | - | 90,643.94 | 75,411.65 |
| ගමන් බෑග් | 14,070.00 | 2,010.00 | - | 16,080.00 | 14,070.00 |
| යන්ත්‍රෝපකරණ | 526,213.56 | 158,363.13 | - | 684,576.69 | 526,213.56 |
| | **42,591,806.12** | **11,158,806.30** | **-** | **53,750,612.42** | **42,591,806.12** |
| ශුද්ධ පොත් අගය | **16,372,613.88** | | | **5,613,389.08** | **16,372,613.88** |

**<u>04 වන සටහන</u>**

**<u>අවිනිශ්චිත ගිණුම</u>**

2019 දෙසැම්බර් මස 31 වන දිනට අත්පිට මුදල් පොතේ ශේෂය රුපියල් 7,142,089.51 ක් වේ. නමුත් මෙම ශේෂය 2020 ජනවාරි මස 01 වන දිනට ඉදිරියට ගෙන ගොස් නොමැත. එබැවින්, 2020 ජනවාරි මස 01 වන දිනට අත්පිට මුදල් පොතේ ශේෂය රුපියල් 0කි.
මෙම වෙනස 2020 දෙසැම්බර් මස 31 වන දිනට වාර්තාගත කරන ලදුව, 2021 වර්ෂයට නිරවුල් කර ඇත
අත්පිට මුදල් පොතේ ශේෂය අධිකරණ අමාත්‍යාංශය සමහ තුලනය කිරීම පිණිස ශේෂය 2020.01.01 වන දිනට ඉදිරියට ගෙන එනු නොලැබූ අතර, වෙනස සඳහා හේතු පහත දැක්වේ.

| | |
|---|---|
| 2019.01.01 වන දිනට ආරම්භක අත්පිට මුදල් පොතේ ශේෂය | 2,815,474.84 |
| අමාත්‍යාංශයට වාර්තා නොකළ ණයා පිටපත් ආදායම | 7,632.74 |
| අමාත්‍යාංශයට වාර්තා නොකළ වියදම් | (308,534.63) |
| දේශකවරුන් විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා අවලංගු කළ චෙක්පත් ආදිය (2019 වර්ෂයේ දී නිකුත් කළ සහ වියදම්, 2019 වර්ෂයේ දී අවලංගු කළ) | 130,678.78 |
| දේශකවරුන් විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා අවලංගු කළ චෙක්පත් ආදිය (2018 වර්ෂයේ දී නිකුත් කළ සහ වියදම්, 2019 වර්ෂයේ දී අවලංගු කළ) | 63,407.10 |
| අත්තිකාරම් පියවීම සහ දිනකට සහ ආනුෂංගික මුදල් ආපසු ලබාදීම (ඍජු තැන්පතු) | 1,749,848.45 |
| 2019 වර්ෂයේ දී CB හි වාර්තා කරන ලද 2018 අග්‍රිම ලැබීම් | 528,982.23 |
| අමාත්‍යාංශය වෙත යවන ලද ආපසු ලැබුණු චෙක්පත් - වියදමක් වශයෙන් අත්පිට මුදල් පොතේ ඇතුළත් කළ සහ එමෙන්ම අමාත්‍යාංශය විසින් අග්‍රිමවලින් අඩුකළ | 2,154,600.00 |
| | 7,142,089.51 |

**<u>05 වන සටහන</u>**

**<u>අත්පිට මුදල් සහ අත්පිට මුදල්වලට සමාන</u>**

| විස්තරය | **2020** | **2019** |
|---|---|---|
| **දෙසැම්බර් මස 31 වන දිනට ශ්‍රීලරු** | **-** | 7,142,489.53 |
| ජංගම ගිණුම | 324,862.48 | 313,191.66 |
| ඉතිරි කිරීමේ ගිණුම | 324,862.48 | 7,455,281.17 |

**<u>06 වන සටහන</u>**

**<u>සමුච්චිත අරමුදලට ගැළපුම්</u>**

| විස්තරය | 2020 | 2019 |
|---|---|---|
| 2020/01/01 දිනට ශේෂය | 6,567,592.14 | 25,861,846.44 |
| 2018 පුනරාවර්තන ප්‍රදානවලින් ප්‍රාග්ධන සංචිතවලට පැවරුම් | - | (59,206.21) |
| ක්ෂයවීම් නිවැරදි කිරීම - 2018 | - | (8,667,566.66) |
| 2019 ලියන ලද චෙක්පත් අවලංගු වීම | 279,100.00 | 63,407.10 |
| 202012/31 දිනට ශේෂය | 6,846,692.14 | 17,198,480.67 |

**<u>07 වන සටහන</u>**

**<u>පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන</u>**

| පත්වීම් දිනය | ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනය තුළ සේවා කාලය | සේවා කාලය වසර වලින් | නම | තනතුර | 2019.12.31 වන දිනට දළ වැටුප | වසරට හිමි පාරිතෝෂික ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|---|
| 2018.10.01 | අවුරුදු 02 මාස 02 දින 30 | 2 | එච්. එම්. කුමුදුණී මදුවන්ති | ලේකම් | 65,100.00 | 65,100.00 |
| 2017.06.01 | අවුරුදු 03 මාස 06 දින30 | 3 | ඩබ්. එම්. එම්. කරුණාරත්න | පර්යේෂණ නිලධාරි | 62,490.00 | 93,935.00 |
| 2015.10.15 | අවුරුදු 05 මාස 02 දින16 | 5 | ඒ. ටී. ජී ගුනතිලක | දෘඩාංග සහ මෘදුකාංග තාක්ෂණ ශිල්පී | 39,310.00 | 98,275.00 |
| 2015.10.15 | අවුරුදු 05මාස 02 දින16 | 5 | කේ. එල්. ඒ කසුන් තාරක පද්මසිරි | දෘඩාංග සහ මෘදුකාංග තාක්ෂණ ශිල්පී | 39,310.00 | 98,275.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2016.06.27 | අවුරුදු 04 මාස 06 දින 4 | 4 | එච්. කේ. ටී. එම්. සෙනෙවිරත්න | ගෘහ පාලක | 32,800.00 | 65,600.00 |
| 2016.06.27 | අවුරුදු 04 මාස 08 | 4 | ආර්. සානිකා ලක්ෂානි | කාර්යාල කාර්ය සහායක | 33,550.00 | 67,100.00 |
| 2016.06.27 | අවුරුදු 04 මාස 08 | 4 | ඩබ්ලිව්. ඒ. මේනකා පද්මසිලි | කාර්යාල කාර්ය සහායක | 33,550.00 | 67,100.00 |
| 2016.06.27 | අවුරුදු 04 මාස 08 | 4 | යූ. ඒ. නදීෂා චතුරංගනී | කාර්යාල කාර්ය සහායක | 33,550.00 | 67,100.00 |
| 2006.01.01 | අවුරුදු 14 | 13 | ජී. ඩබ්ලිව්. රංජිත් | රියදුරු | 33,550.00 | 67,100.00 |
| | | | | | | 889,915.00 |

| | 2020 | 2019 |
|---|---|---|
| 2020/01/01 දිනට ප්‍රතිපාදන | 741,536.00 | 543,554.40 |
| 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන | 888,915.00 | 741,536.00 |
| වර්ෂය සඳහා වන පාරිතෝෂික දීමනා වියදම් | 147,379.00 | 197,981.60 |

**08** වන සටහන

උපචිත වියදම්

| | | |
|---|---|---|
| ගෙවිය යුතු උපදේශන දීමනා | 134,325.00 | 93,669.93 |
| ගෙවිය යුතු දුරකථන බිල් ගෙවිය යුතු | 31,259.56 | 49,814.62 |
| ගෙවිය යුතු ආරක්ෂක සේවක ගාස්තු | 138,810.37 | 138,810.37 |
| ගෙවිය යුතු පවිත්‍රතා වියදම් භාරකාර | 57,975.00 | 55,863.00 |
| ගෙවිය යුතු මුද්‍රණ වියදම් | - | 153,875.00 |
| ගෙවිය යුතු පරිවර්තන ගාස්තු | - | 6,000.00 |
| | 362,369.93 | 498,032.92 |

**09 වන සටහන**

**වෙනත් ගෙවීම්**

| | | |
|---|---|---|
| ගෙවිය යුතු ආයතනික ගාස්තු | 439,711.34 | 1,467,068.99 |

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන්

**10 වන සටහන**

| **රජයේ ප්‍රදාන ලැබීම්** | 2020 | 2019 |
|---|---|---|
| ජනවාරි | 2,700,000.00 | 3,216,482.23 |
| පෙබරවාරි | 1,000,000.00 | - |
| මාර්තු | 1,500,000.00 | 4,470,000.00 |
| අප්‍රේල් | 1,000,000.00 | - |
| මැයි | 900,000.00 | 2,235,000.00 |
| ජූනි | (735,796.02) | 370,100.00 |
| ජූලි | 2,000,000.00 | 8,973,585.81 |
| අගෝස්තු | 500,000.00 | 40,074,250.71 |
| සැප්තැම්බර් | 2,800,000.00 | 3,483,303.20 |
| ඔක්තෝබර් | - | 21,736.20 |
| නොවැම්බර් | 1,500,000.00 | 6,880,000.00 |
| දෙසැම්බර් | 1,324,305.47 | (231,213.70) |
| | 14,488,509.45 | 64,493,244.45 |
| විලම්බිත ආදායම්වලට පැවරුම් | - | (11,600.00) |
| ප්‍රාග්ධන සංචිතවලට පැවරුම් | (400,181.50) | (1,291,309.99) |
| | 14,088,509.45 | 68,985,334.46 |
| අධිකරණ අමාත්‍යාංශයෙන් කරන ලද ගෙවීම් | | |
| විදුලි බල හා ජල සැපයුම් වියදම් | 546,111.17 | 795,109.44 |
| ආරක්ෂක වියදම් | 477,575.73 | - |
| | 15,112,014.85 | 68,985,443.90 |

**11 වන සටහන**

වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| වෙනත් ආදායම් | 38,710.00 | 9,000.00 |
| | **38,710.00** | **9,000.00** |

**12 වන සටහන**

**වැටුප් හා වේතන**

| | | |
|---|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය - සේවක අර්ථසාධක අරමුදල් බැරකම් | 5,134,500.62 | 4,405,101.61 |
| උපදේශක දීමනා - සේවක අර්ථසාධක අරමුදල් නොවන බැරකම් | 854,126.86 | 1,138,769.93 |
| | **5,988,627.48** | **5,743,871.54** |
| | | **9,000.00** |

**13 වන සටහන**

| | | |
|---|---|---|
| **සම්මන්ත්‍රණ සහ පුහුණු වියදම්** | 69,079.00 | |
| දේශීය පුහුණු සඳහා තේපැන් සහ වෙනත් සංග්‍රහ වියදම් | 31,990.00 | 436,083.95 |
| වැඩමුළු සහ දේශීය පුහුණු | 1,239,500.00 | 5,170,316.87 |
| එල්එල්එම් ප්‍රතිපූරණ | 1,340,569.00 | 6,285,500.00 |
| | | **11,891,900.82** |

**14 වන සටහන**

**විදෙස් පුහුණු වියදම්**

| | | |
|---|---|---|
| ගුවන් ගමන් ගාස්තු | - | 6,673,800.00 |
| ගමන් රක්ෂණ | - | 162,139.55 |
| ආනුෂංගික දෛනික ගෙවීම් | 557,567.94 | 32,374,488.54 |
| ආයතනික ගාස්තු | - | 1,801,862.85 |
| උණුසුම් ඇඳුම් වියදම් | - | 54,086.19 |
| | | **41,063,377.13** |

**15 වන සටහන**

**වාර්ෂික දායක මුදල් ගාස්තු**

| | | |
|---|---|---|
| වාර්ෂික දායක මුදල් ගාස්තු - ලෝ නෙට් | 538,500.00 | 314,125.00 |

**16 වන සටහන**

**ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තුව**

| | | |
|---|---|---|
| යන්ත්‍රෝපකරණ සේවා ගිවිසුම | 44,089.43 | 107,531.57 |
| උපකරණ අළුත්වැඩියාව සහ ප්‍රතිස්ථාපනය | 106,224.23 | 104,362.58 |
| මුද්‍රණ යන්ත්‍රය සඳහා ටෝනර් | 326,529.43 | 382,174.98 |
| ගොඩනැගිලි නඩත්තුව | 36,260.00 | - |
| ගිනි අනතුරු පද්ධතිය | - | - |
| ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ දුරකතන පද්ධතිය | 9,085.45 | - |
| | 522,188.54 | **594,069.13** |

**17 වන සටහන්**

| | | |
|---|---|---|
| **PPE සඳහා ක්ෂයවීම්** | | 283,847.44 |
| කාර්යාල උපකරණ | 725,443.35 | |
| පුස්තකාල පොත් | 382,090.66 | 694,310.66 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 9,782,612.19 | 382,090.66 |
| පරිගණක උපකරණ | 93,054.68 | 11,164,753.12 |
| විදුලි රක්ෂණ | 15,232.29 | 272,887.55 |
| පැන්ට්රි අයිතම | 2,010.12 | 15,232.29 |

| | | |
|---|---|---|
| ගමන් මළු | 158,363.13 | 2,010.00 |
| යන්ත්‍රෝපකරණ | 11,158,806.30 | 158,363.13 |
| | | **12,983,494.85** |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් සටහන්**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සෘජු ක්‍රමය මත සකස්කර ඇත.

**18 වන සටහන**

**වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ**

| | | |
|---|---|---|
| වැටුප් සහ වේතන | 4,791,641.78 | 4,242,455.21 |
| උපදේශක ගාස්තු | 813,121.79 | 1,134,000.00 |
| සේවක අර්ථසාධක අරමුදල් වියදම් | 1,027,122.12 | 976,553.79 |
| සේවක භාරකාර අරමුදල් වියදම් | 154,068.31 | 146,483.07 |
| අතිකාල | 87,375.25 | 362,821.41 |
| නිල ඇඳුම් දීමනා | 4,000.00 | 4,000.00 |
| කාර්ය මණ්ඩල පුහුණුවීම් | 12,000.00 | 145,475.00 |
| උත්සව අත්තිකාරම් | - | 80,000.00 |
| අනෙකුත් කාර්යමණ්ඩල දීමනා | 29,984.71 | - |
| | 6,919,313.96 | 7,091,788.48 |

**19 වන සටහන**

**මෙහෙයුම් කටයුතු**

| | | |
|---|---|---|
| සම්මන්ත්‍රණ හා පුහුණු වියදම් | 31,990.00 | 5,606,375.82 |
| විනිසුරුවරුන්ට ගෙවූ එල්එල්එම් ගාස්තු | 1,239,500.00 | 6,285,500.00 |
| විදෙස් පුහුණු වැඩසටහන් | 1,584,925.59 | 40,447,087.52 |
| සම්මන්ත්‍රණ සහ වෙනත් වැඩසටහන් සඳහා තේපැන් සංග්‍රහ වියදම් | 69,079.00 | 171,366.00 |
| ආරක්ෂක ගාස්තු | 666,289.68 | 875,848.68 |
| වීඩියෝ සම්මේලන ගාස්තු | - | - |
| වාර්ෂික දායක මුදල් ගාස්තු | 538,475.00 | 314,100.00 |
| විගණන ගාස්තු | 297,000.00 | 422,625.00 |
| | **4,427,259.27** | **541,122,903.02** |

**20 වන සටහන**

**සැපයුම් හා භාවිතා කළ පාරිභෝජකයන්**

| | | |
|---|---|---|
| පුවත්පත් සැපයීම් | | - |
| තැපැල් ගාස්තු | 14,240.00 | 29,275.00 |
| කාර්යාල ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම | 21,705.00 | 467,100.00 |
| ඉන්ධන වියදම් | 105,903.00 | 84,387.64 |
| වෙනත් සේවා හා සැපයීම් | 03,575.39 | 852,499.68 |
| ගමන් වියදම් | 1,968.29 | 31,440.82 |
| ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තුව | 45,345.45 | - |
| වාහන නඩත්තුව | 40,438.26 | 71,661.71 |
| ටෝනර් සැපයුම් | - | 382,124.98 |
| මුද්‍රණ වියදම් | 937,812.60 | - |
| කාර්යාල උපකරණ නඩත්තුව සහ වෙනත් සේවා | 476,743.09 | 211,794.15 |
| දුරකථන හා අන්තර්ජාල ගාස්තු | 539,415.64 | 1,143,080.14 |
| පවිත්‍රතා ගාස්තු | 653,813.00 | 657,899.00 |
| පරිවර්තන ගාස්තු | 11,545.00 | 80,840.00 |
| | **3,052,504.72** | **4,012,103.12** |

21 වන සටහන

**මූල්‍ය පිරිවැය**

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 4,250.00 | 3,750.00 |
| | 4,250.00 | **3,750.00** |

**22 වන සටහන**

**ස්ථිර වත්කම් මිලට ගැනීම**

| | | |
|---|---|---|
| කාර්යාල උපකරණ | - | - |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | - | - |
| පුස්තකාල පොත් | 400,181.50 | 11,600.00 |
| පරිගණක උපකරණ | - | - |
| විදුලි උපකරණ | - | - |
| පැන්ට්රි අයිතම | - | - |
| යන්ත්‍රෝපකරණ | - | - |
| | 400,181.50 | **11,600.00** |

## අභියෝග

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සිය දීර්ඝ කාලීන ගමන් මාර්ගය තුළ දී අන්තර්ජාතික අධිකරණ පුහුණු වීම් ලබාගැනීම, අනෙකුත් අධිකරණ අධ්‍යයන ආයතන, යුරෝපා සංගමය සහ එක්සත් ජනපදයේ අධිකරණ දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ හවුල්කාරත්වයන් ගොඩනගා ගැනීම වැනි බොහෝ උත්කෘෂ්ට ජයග්‍රහණ ගණනාවක් අත්පත් කරගෙන ඇත.

එසේ වුව ද, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය හමුවේ තවදුරටත් පවත්නා අභියෝග මෙසේ දැක්විය හැකිය.

- සියළුම මූලික පහසුකම් සහිත අධිකරණ ආයතනයක් පවත්වාගෙන යාම පිණිස වෙන් වූ ගොඩනැගිල්ලක් ලබාගැනීමේ දැඩි අවශ්‍යතාව.
- කල් ගතවන දෙපාර්තමේන්තු කාර්ය පටිපාටි.
- වැඩසටහන් ක්‍රියාත්මක වීමේ දි උද්ගත වන මූල්‍යමය සීමාවන්

## ස්තූතිය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙනුවෙන් ලබාදුන් සහාය සහ සහයෝගීතාව අගය කරමින් ශ්‍රී ලංකා විනිශ්යකාරවරයන්ගේ ආයතනය විසින් පහත සඳහන් ආයතන සහ තැනැත්තන් වෙත සිය ස්තුතිය පළකර සිටිනු ලැබේ.

1. කළමණාකරණ මණ්ඩලය
2. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය
3. අධිකරණ සේවා කොමිෂන් සභාව සහ එහි කාර්ය මණ්ඩලය
4. මහා භාන්ඩාගාරයේ ලේකම්තුමා සහ මහා භාන්ඩාගාරයේ කාර්ය මණ්ඩලය
5. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)
6. විගණකාධිපති සහ ඔහුගේ කාර්ය මණ්ඩලය
7. බන්ධනාගාර අධිකාරී සහ ඔහුගේ කාර්ය මණ්ඩලය
8. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ටාර්
9. අභියාචනාධිකරණයේ රෙජිස්ටාර්.
10. ශ්‍රේෂ්ඨාධිකරණයේ මාෂල්
11. අධිකරණ වෛද්‍ය නිලධාරි, කොළඹ

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } JLO/B/SLJI/01/FA/20/11/EF    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2022 දෙසැම්බර් [illegible] දින

අධ්‍යක්ෂ,

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය.

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කර නොතිබූ බැවින් ගණුදෙනු පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව 2022 අගෝස්තු 22 දිනපාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ප්‍රාග්ධන ප්‍රදානයන් ක්‍රමක්ෂය ක්‍රමයට ගිණුම්ගත කර නොතිබුණු අතර ඒවා ගිණුම්ගත කිරීමේදී අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තියද හෙළිදරව්කර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි දක්වා ඇති ආකෘතියට අනුකූලව සකස් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කල යුතු වුවත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අගය ශූන්‍ය වී තිබූ රු. 3,327,855 ක් වූ ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. ඒ අනුව මෙම ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.59,364,602 ක් වූ ජංගම නොවන වත්කම් අත්පත් කරගත් දිනයන් සහිතව ඒවල ශේෂ තහවුරු කෙරෙන උපලේඛණයක් හෝ ස්ථාවර වත්කම් ලේඛණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබීම නිසා එම වත්කම් වලට අදාලව ගිණුම්ගත කර තිබූ වටිනාකම හා එහි ක්ෂය වටිනාකම වූ රු. 11,158,806 ක ගණනය කිරීම්වල නිරවද්‍යතාවය තහවුරුකරගත නොහැකි විය.

(ඉ) 2019 දෙසැම්බර් 31 දිනට වූ රු. 7,142,090 ක මුදල් පොතේ ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස මුදල් පොතට ගෙන නොතිබුණු අතර එය අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ලෙස ජංගම වත්කම් වල නිරවුල් නොකර පැවතුණි. වර්ෂය අවසාන දිනට මුදල් පොතේ පැවති එම අතිරික්ත මුදල් රේඛීය අමාත්‍යාංශයට යවා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබීම නිසා මෙම අවිනිශ්චිත ශේෂය ඇතිවී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්

3

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද ආයතනයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 ඔක්තෝබර් 11 දින දීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

2016 වර්ෂයේදී රු.3,517,995 ක් වැයකර නීති දත්ත පද්ධතියක් සකස්කර තිබුණද එහි පැවති අඩුපාඩු නිවැරදි කර යාවත්කාලීන කර නොතිබීම නිසා එය භාවිතයට ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

6